# බෞද්ධාලෝකය

QD/112/NEWS/2020
ISSN 2613-8743

17 වැනි කාණ්ඩය 2 වැනි කලාපය ශ්‍රී බුද්ධ වර්ෂ 2563 - මැදින් - බක් (මාර්තු - අප්‍රේල්) සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනයකි



# බෞද්ධාලෝකය

මැදින් - බක්

## ලිපි සරණිය


- **ධම්මපදය** - ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ 2
- **මැදින්/බක් පුර පසළොස්වක පොහොය දිනයේ සිදු වූ අසිරිමත් සිදුවීම් පෙළහර** - ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ 3
- **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාණන්ගේ අභිමානවත් චින්තනයන් මල්පල ගන්වමු!** - 7
- **අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි** - කේ.වී.ඩී. අරුණි සසංගිකා 10
- **මංගල සූත්‍රයෙන් පෙන්නුම් කර ඇති සමාජ පසුබිම අදට ගැළපේ ද?** - හේමමාලි ලියනගේ 12
- **සුගලා දේවියගේ උඳුන්දොර රජදහන (මොණරාගල ගලබැද්ද ප්‍රදේශය)** - ආර්.ඩී.සී.රාමනායක 16
- **දැනගෙන යමු සිරිපාදේ** - නිශාන්ත ගුණසේකර 19
- **රාජ්‍ය පාලනයට අවැසි දස සක්විතිවත්** - ආචාර්ය රාජකීය පණ්ඩිත මැටිබැඹියේ ධම්මසිරි හිමි 24
- **සාර්ථක පවුල් ජීවිතයක් උදෙසා...** - පූජ්‍ය බදුල්ලේ මහානාම ස්වාමීන් වහන්සේ 27
- **කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය 4** - ආචාර්ය එම්.ඩබ්ලිව්. දුලීකා හර්ෂණී 30
- **කුහක ජාතකය** - ආර්.එම්. දිලිනි දිල්රුක්ෂි 33
- **බුද්ධ කාලීන භාරතීය සමාජ පසුබිම** - ඩී.එම්. තුෂාරි මංගලිකා 36
- **ත්‍රිලක්ෂණය හා බන්ධායතන ධාතු විභාගය...** - පූජ්‍ය වැල්කෙනියායේ විමලවංශ හිමි 39
- **දහම් දැනුම** - කේ.වී.ඩී. අමානි ඉසංගිකා 41
- **බොදු සමුළු පුවත්** - 42



**සංස්කාරක මණ්ඩල උපදේශකත්වය**
ආචාර්ය කලාසූරි ප්‍රණීත් අභයසුන්දර

**සංස්කාරක මණ්ඩලය**
සිරිල් ගුණසේකර
දම්සිරි අජිත්
ආනන්ද බෝධිනායක
ඉසංකා දමයන්ති වික්‍රමසිංහ

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

බොදු සමුළු පුවත් සියලු ඡායාරූප: **මහේෂ් සේනාධීර**

**පිටු සැකසුම**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**මුද්‍රණය**
ෆාස්ට් ප්‍රින්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන : 011 2691695 / 011 2688517 / 011 2667017
ෆැක්ස් : 011 2688517 web : www.acbc.lk
E-mail: acbc380@gmail.com

# සුපහන් ජීවිතයකට ධම්මපදය

**න පරේසං විලෝමානි**
**න පරේසං කතාකතං**
**අත්තනෝව අවෙක්ඛෙය්‍ය**
**කතානි අකතානි ච**

**පදගතාර්ථය :-**

| | |
|---|---|
| **පරේසං** | - අනනුගේ |
| **විලොමානි** | - ඵරුෂ වචනයෝ |
| **න මෙනෙහි** | - නො කටයුත්තා හ |
| **පරෙසං** | - අනුන් විසින් කතා කළ නො කළ දේ ද |
| **න** | - නො බලන්නේය |
| **අත්තනෝ එව** | - තමා විසින් ම |
| **කතානි** | - කළ දේ ද |
| **අකතානි ච** | - නොකළ දේ ද |
| **අවෙක්ඛෙය්‍ය** | - විමසා බලන්නේය |

**නිදාන කථාව**

මේ ගාථාව අප බුදුන් වහන්සේ සැවැත් නුවර දී පාඨිකාජීවකයන් අරභයා දේශනා කරන ලද්දකි. සැවැත් නුවර වැසි නිගාවට බොහෝ විලි ඇති කුලඟනක දරුවන් අතර පාඨිකාජීවක නැමැත්තෙක් වෙයි. ඔහු ඈ කුසඳ දරුවෙක් නො වුවත් දරු තනතුරෙහි ලා පිළිදැගුම් (සාත්තුසප්පායම්) කිරීමෙහි අඩුවෙක් නැත. සිය පවුලට හිත කැමැති ව අබිවැඩ සලසන හෙයින් පාඨිකාජීවකයන්ට මව හා දරුවෝ අවනත ව සිටිති. ආජීවකයා අන් ගෙදරක වෙසෙතත් මව ගේ ගෙදෙර හැමදෙයක් ම පිරික්සා බලයි. ඔහුගෙන් අසා යමක් කිරීම මව ගේ සිරිත විය.

මව වෙසෙන ගේ ළඟ නිවැසි මිනිස්සු වෙහෙරට බුදුපුදයට හා දහම් ඇසුමට නිතර යති. ඔවුන් ගෙදරින් යන කෙනෙක් නැත. බණ අසා එන ගැහැණු - පිරිමි සැදැහැයෙන් ඔදවැඩි සිතැති ව බුදුගුණ පවසා බුදුබණ වණති. "අහෝ! බුදුගුණ සුවඳ මැ ය. දහම් රස මිහිරි මැ"ය කියති. ඒ අසා මව ආජීවකයාට වෙහෙරට දහම් ඇසීමට යාමේ රිසිය දැන් විය. ඔහු කිපී නො සන්සුන් ගති පා මව ගේ ගමන වැළකී ය. මව බුදුරදුන් සිය නිවසට වැඩමවා දන් පිළිගන්වා බණ ඇසුමට සිතා සිය පුතු කැඳවා බුදුරදුනට අයැදුම් පිළිගන්වා යැවී ය. ඔහු පළමුකොට ආජීවකයන් ගේ නිවසට ගොස් අයැදුමට වෙහෙරට යාම සඳහා ආ බව කීයේ ය.

පාඨිකාජීවකයා ගමන වැළැක්වීමට තැත් කෙළේය. මව ගේ වචනය ඉටු කිරීමේ අදහස ඉතා දැඩි වූ හෙයින් ඒ වෑයම නිසරු වි ය. එසේ නම් අයැදුම කොට ගෙදරට යන මං වරද්දනු සඳහා " අසුවල් වීදිය - අසුවල් පාර - අසුවල් ගෙය"යි නො කියා අන් මඟකින් එව යි කීයේ ය. "එසේ කළ කල ගමන වළකී යි මව සෑදූ රසවත් ආහාර අපි කමු"යි කීය. දන් පිළිගන්වන දින ඒ නිවට අදහසින් පැමිණි ආජීවකයන් මවු පිටිපස ගෙයක නතර කැරැවී ය. මොනවට මං දත් බුරදුන්ට මං කිවයුතු නො වේ. බුදුරදුන් වැඩි සඳ රසමුසු දන් පිළිගැන් විය. බණ අසන අතර "සාදු සාදු" යන හඬ මව මුවින් නැගුණි. ආජීවකයා ඉවසුම් නැති ව වහා ඉදිරියට පැන බැණ වැද පලා ගියේ ය. බුදුරදහු විලි ගැනුණු උවැසිය සනහා "අනුන් ගේ බැනුම් - දෙඩුම් හා කළ නො කළ දැය නො සිතිය යුතු බව ද තමා කළ නො හොඳ හා නොකළ යහපත පමණක් සිතා බැලිය යුතු" බව ද දක්වා ඒ උවැසිය සෝවාන් මඟ පිහිට වූ සේක.


**ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ**
සහය කථිකාචාර්ය


# මැදින් පුර පසළොස්වක පොහොය දිනයේ සිදු වූ අසිරිමත් සිදුවීම් පෙළහර

- **බුදුරජාණන් වහන්සේ සිය නෑදෑ හිතමිතුරාදින්ට සහ ජන්ම භූමියට කෘතගුණ සැලකීම සඳහා පළමුවරට කිඹුල්වත් පුරයට වැඩම කිරීම**

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු භාග්‍යවතුන් වහන්සේ විසිදහසක් පමණ ආර්ය මහා සංඝයා පිරිවරාගෙන සුද්ධෝදන පිය රජතුමාටත් ස්වකීය ඥාතීන් වූ ශාක්‍ය වංශිකයන්ටත් අමා මහ නිවන් සුව ලබා දෙනු වස් රජගහනුවර වේළුවනාරාමයෙහි සිට කිඹුල්වත් පුරටයට වැඩම වීමට ගමනාරම්භය සිදුවූයේ මැදින් පුන් පොහෝ දිනයක ය.

- **කිඹුල්වත් නුවරට වැඩමකොට සුද්ධෝදන රජුට දහම් දෙසීම.**

සුද්ධෝදන රජතුමා හට ස්වකීය පුත්‍ර රත්නය දැකීමේ ආශාව බලවත් විය.



බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයට වැඩමවා ගනු පිණිස සුද්ධෝදන රජතුමා ඇමතියෙකු කැඳවා පුරුෂයන් දහසක් පිරිවර වශයෙන් දී රජගහ නුවරට ගොස් රජහුගේ පණිවුඩය කියා බුදුරදුන් වැඩමවාගෙන එන්නට පිටත් කෙළේය. ඔහු පිරිසක් සමඟ කපිල වස්තු පුරයෙහි සිට සැට යොදුන් මග ගෙවා රජගහ නුවර වේළුවනාරාමයට ගියේ ය. එවේලෙහි බුදුරජාණන් වහන්සේ සිවුපිරිස මැද දහම් දෙසමින් වැඩ විසූහ. ඇමති තෙමේ රජුගේ පණිවුඩය පසෙකින් තබා බණ අසා පිරිවර සමඟ රහත් ව මහණ විය. රජතුමා ඇමතියා ආපසු නො පැමිණෙන හෙයින් නැවත ද ඇමතියකු ඇතුළු දහසක් පිරිස යැවී ය. මෙසේ සුද්ධෝදන රජතුමා නව වාරයක් ඇමතියන් නව දෙනකු ප්‍රධාන නවදහසක් පිරිස බුදුරදුන් කිඹුල්වත් පුරයට වැඩමවාගෙන එනු පිණිස යැවී ය. එහෙත් බුදුරදුන් සිය නුවරට ගෙන්වා ගන්නට අසමත් විය. ඒ සියලු දෙනා ම බණ අසා රහත්ව පැවිදි වූහ.

අවසානයෙහි සුද්ධෝදන රජතුමා බෝසතුන් හා එකදා උපන් කාලුදායි නම් ඇමතියා කැඳවා, 'දරුව', මාගේ පුත්‍රයා කැඳවා ගෙන එනු පිණිස ඇමැතියන් නව දෙනකු නව දහසක් පිරිස සමඟ බුදුන් වෙත යැවීමි. එහෙත් ඔවුන් ගැන කිසිදු ආරංචියක් නො මැත. මාගේ ජීවිතය අවසන් වන්නට පෙර, පුත්‍රයා කැඳවාගෙන වුත් දක්වා ලන්නට හැකි දැයි" විචාළේය. එබසට අමාත්‍ය තෙමේ, ඉදින් පැවිදි වන්නට අවසර දෙතොත් එය ඉටු කරන්නෙමි, යි කීයේ ය. රජතුමා එයට අවසර දුන්නේ ය. කාලුදායි ඇමතියා පිරිවර දහසක් පිරිස සමඟ වේළුවනාරාමයට ගොස් බණ අසා පිරිවර සහිත ව රහත් ව මහණ විය. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මේ වන විට විසි දහසකටත් අධිකය. ශාක්‍ය ජනපදයෙන් පැමිණි පිරිස දස දහස් දසයෙක් (10010) වූහ.


අංග, මගධ දෙරටින් පැමිණ පැවිදි වූ පිරිස දස දහසෙකි. කාලුදායි රහතන් වහන්සේ මහණ ව සතියකින් පසුව බුදුරජාණන් වහන්සේට කිඹුල්වත් පුරයට වඩින ලෙස ආරාධනා කළහ. සුද්ධෝදන පියරජතුමා තමන් වහන්සේ දක්නට කැමැත්තෙන් සිටින බව ද පැවසූ හ. බුද්ධත්වයෙන් දසමසක් සම්පූර්ණ විය. මැදින් පුර පසළොස්වක් පොහොය එළඹියේ ය. බුදුරජාණන් වහන්සේ දිනකට යොදුන බැගින් සැට දිනකින් සැට යොදුන් මඟ ගෙවා කිඹුල්වත් පුරයට වැඩම කළහ. මේ කාලය තුළ පිය රජතුමාගේ මාළිගයෙන් කාලුදායි රහතන් වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේට පිණ්ඩපාතය ගෙනවුත් දෙන ලදී. ශාක්‍යයෝ බුදුන් ප්‍රමුඛ විසි දහසක් භික්ෂු සංඝයා හට වැඩ සිටීමට නිග්‍රෝධ කුමාරයාගේ උයනෙහි ආරාමයක් සාදවා තැබූහ.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළහ. ශාක්‍යයෝ බුදුරදුන් ප්‍රමුඛ භික්ෂු පිරිස පිළිගෙන නිග්‍රෝධාරාමයට වැඩමවා ගෙන ගිය හ. මානයෙන් යුත් ශාක්‍ය රජවරු බුදු වුවත් ඔහු අපට බාලය යි කල්පනා කොට බුදුරජාණන් වහන්සේට නො වැඳ බාල කුමරු කුමරියන් ලවා වැන්ද වූහ. ඔවුන්ගේ අදහස් දැනගත් බුදුපියාණන් වහන්සේ මානය දුරු කරනු පිණිස අහසට නැඟ යමාමහ පෙළහර දැක්වූහ.

මෙය දුටු සුද්ධෝදන රජතුමා මේ මාගේ තුන්වන වැඳීම යැයි කියමින් බුදුරජාණන් වහන්සේට වැන්දේ ය. සෙසු ශාක්‍ය රජවරු ඉන්පසු බුදුරජාණන් වහන්සේට නමස්කාර කළහ. එකල්හි මහා වැස්සෙක් විය. එය නිමිති කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙස්සන්තර ජාතකය දේශනා කළහ. ශාක්‍යයෝ බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට නිවෙස්කරා ගියහ. කිසිවකු හටත් පසුවදා දානයට ආරාධනා කරන්නට නො හැකි විය. බුදුරජාණන් වහන්සේ පසුවදා උදෑසන විසි දහසක් රහතන් වහන්සේ පිරිවරා කිඹුල්වත් පුරය වැඩ ගෙපිළි වෙළින් පිඬු පිණිස හැසුරුණු සේක. මෙය දුටු යසෝදරා දේවිය ඒ බව සුද්ධෝදන රජතුමා හට කීවා ය. එය ඇසූ රජතුමා ලජ්ජාවට පත්ව සළුව හඳිමින් වේගයෙන් රජ මාළිගයෙන් නික්මී ගොස් බුදුන් වැඳ, ස්වාමීනි, පිඬු සිඟීමෙන් කුමක් හෙයින් අපට නින්දා කරන්නේ දැයි ඇසී ය. 'මහ රජ, මේ අපගේ බුද්ධවංශයෙහි සිරිතැ යි කියමින් පිය රජතුමාට මගදී ම ධර්ම දේශනා කළහ.

## ■ යසෝධරා දේවිය උදෙසා චන්ද කින්නර ජාතකය දේශනා කිරීම.

බුදුරජාණන් වහන්සේ සිය රජුත් සමඟ යශෝධරාවන්ගේ ගෙට වඩින සේක් යශෝධරාවන්ගේ ශෝකය සංසිඳෙන තුරු ඇයට සිත් සේ වඳින්නට ඉඩ දෙන ලෙස වදාළහ. බුදුරජාණන් වහන්සේ යශෝධරාවන්ගේ ගෙට වැඩම කොට පනවන ලද අසුනෙහි වැඩ හුන් සේක. බුදුරජාණන් වහන්සේ එහිදී සඳ කිඳුරු ජාතකය වදාරා යශෝධරාවන්ගේ අතීත සම්බන්ධතාව පිළිබඳ කරුණු පැහැදිලි කළහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ නිග්‍රෝධාරාමයට වැඩම කළහ.



## ■ රාහුල කුමාරයා සහ නන්ද කුමාරයා පැවිදි කරවීම

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩි තුන්වැනිදා නන්ද කුමාරයන්ගේ රාජ්‍යාභිෂේක මංගල්‍යය ද, ගෘහ ප්‍රවේශ මංගල්‍යය ද, විවාහ

මංගල්‍යය දැයි මංගලත්‍රයයෙක් විය. මේ උත්සව දිනයෙහි බුදුපියාණන් වහන්සේ නන්ද කුමරුගේ මාළිගයට වැඩම කොට දන් වළඳා පාත්‍රය ඔහු අතට දී පෙරටුව වැඩියහ. නන්ද කුමරු දැන් බුදුරජාණන් වහන්සේ පාත්‍රය ගන්නා සේකැ,"යි සිතමින් බුදුන් කෙරෙහි ගෞරවය නිසාම නිශ්ශබ්දව පසු පස පාත්‍රය රැගෙන ගියේ ය.

නන්ද කුමාරයන් හා විවාහ වීමට සිටි ජනපද කල්‍යාණී නම් රාජ කුමාරිය නන්ද කුමාරයා බුදුරදුන් පසු පස යනු දැක "ස්වාමි පුත්‍රය, වහා එනු මැනැවැ"යි කීවාය. ඒ වචනය ඇසූ නන්ද කුමාරයාගේ හදවත කම්පා විය. එහෙත් බුදුරජාණන් වහන්සේට පාත්‍රය ගන්නා සේ කියන්නට නො හැකි හෙයින් එයත් රැගෙන විහාරයට ම ගියේ ය.


ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, "නන්දය, මහණ වන්නෙහි දැයි ඇසූහ. කුමාර තෙමේ ජනපද කල්‍යාණීය නිසා එයට නොකැමති නමුත් බුදුන් කෙරේ ගෞරවයෙන්, එසේය ස්වාමීනි, පැවිදි වන්නෙමියි කීය. එකෙනෙහි ම බුදුහු සිය මළණුවන් පැවිදි කරවූහ. ඔහු පසු කලෙක දී සියලු කෙලෙසුන් නසා රහත් විය.

තථාගතයන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම වීමෙන් සත්වැනි දිනය එළඹියේ ය. බුදුහු විසිදහසක් මහා සංඝයා පිරිවරා ගෙන සුදොවුන් රජුගේ මාළිගයට වැඩම කළහ. යශෝධරා දේවි තොමෝ සත් හැවිරිදි සුරතල් රාහුල කුමරුන් සරසා නරසීහගාථා කියා පියා ගැන හඳුන්වා පියා සතු ධනය ඉල්ලා ගන්ට යැයි පවසා බුදුරජාණන් වහන්සේ වෙත යැව්වා ය. රාහුල කුමාරයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ පිතෘ ප්‍රේමය උපදවා ගෙන පියාණන් වහන්ස, ඔබ වහන්සේගේ සෙවණෙහි වාසය මට සැප යැයි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අනුමෙවෙනි බණ වදාරා මාළිගයෙන් වැඩිසේක. රහල් කුමරා ද බුදුන් පසු පස ගියේය. කිසිවෙක් ඔහු නොනැවැත්වූහ. විහාරයට වැඩම කළ බුදුහු රාහුල කුමරුන් පැවිදි කරන සේ සැරියුත් හිමියන්ට පැවැරූ සේක. සැරියුත් හිමි රාහුල කුමරා පැවිදි කළේය. රාහුල කුමරුන්ගේ හිස කෙස් බා සිවුරු හැන්දවීම මුගලන් හිමියන් විසින් ද, අවවාද දීම මහ කසුප් හිමියන් විසින් ද, උපාධ්‍යායවීම සැරියුත් හිමියන් විසින් ද සිදු කරන ලදි.

# බක් පුර පසළොස්වක පොහොය දිනයේ සිදු වූ අසිරිමත් සිදුවීම් පෙළහර

- **බුදුන් වහන්සේ නාගදීපයට වැඩම කොට චූලෝදර හා මහෝදර අතර මිණි පළඟක් අරබයා වූ ගැටුම සමථයකට පත්කිරීම (බුදුරදුන්ගේ දෙවන ලංකා ගමනය සිදුවීම.)**

චූලෝදර ගේ සීයා කලුරිය කරන කල්හි තමා සතුව තිබුණු ඉතා වටිනා මැණික් පුටුව පුතාට නොදී චූලෝදර ගේ මවගේ දියණියන් හට දුන්නේ ය. මාමා සහ බෑණා එනම්, චූලෝදර මහෝදර යන නාරජුන් දෙදෙනා අතර යුද්ධයට හේතුවූයේ මේ මිණි පළඟ ය. බුදුරජාණන් වහන්සේ බක්



අවපසළොස්වක් පොහෝදා උදෑසන ලක්දිව නාගදීපයට වැඩමවා අහසෙහි සිට එහි යුද බිමට වැද සිට දෙපසෙහි නාගයන් බිය ගන්වනු සඳහා මහත් ගන අඳුරක් මැවූහ. නාගයන් බියෙන් හැකිලී සිටින විට ආලෝකයක් මවා මුන් වහන්සේ ඔවුනට දක්නට සැලැස්වූහ. එයින් ඉමහත් සොම්නසට හා සැනසීමට පත් නාගයෝ සර්වඥයන් වහන්සේ දැක බුදුසිරිපා කමල් වැන්දාහ.

ලෝකනාථයන් වහන්සේ චූලෝදර මහෝදර නා රජුන් දෙදෙනා ප්‍රමුඛ දෙපක්ෂයේ පිරිස සමගි කරවීමට සමත් ධර්මයක් ඔවුනට දේශනා කළහ. සසර ආදීනව, මක්ඛ පලාසාදින්ගේ ආදීනව කාකොලුක ජාතකය, එන්දක ජාතකය, ලටුකික ජාතකය, වට්ටක ජාතකය යන මේවායින් වෛර කිරීමෙහි ඇති දෝෂයන් හා සමගි බවේ ඇති අනුසස් ද ප්‍රකාශ කරමින් බුදුහු අවවාද දුන්හ. පසුව යුද වැදී සිටි නා රජුන් දෙදෙනා ධර්ම කථා ශ්‍රවණයෙන් අපමණ ප්‍රීතියට පත්ව යුද්ධයට හේතු වූ මිණිපළඟ තථාගතයන් වහන්සේට පිදූහ. අහසින් බැස එහි වැඩ හුන් සර්වඥයන් වහන්සේ නාගයන් විසින් පිළිගන්වන ලද දිව්‍ය ආහාර පාන වළඳා අවසානයේ අසූ කෝටියක් නාගයන් තිසරණ සහිත පන්සිල් හි පිහිටුවා පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් වැඳුම් පිදුම් කරනු පිණිස කිරිපලු රුක හා මිණි පළඟ නාගයන්ට පවරා දී සැවැත්නුවර දෙව්රම් වෙහෙරට පෙරළා වැඩියහ.

**ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ**
සහය කථිකාචාර්ය

---


# බෞද්ධාලෝක වෙසක් ශ්‍රී බු.ව. 2564 / ව්‍ය:වර්ෂ 2020

**කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ "බෞද්ධාලෝක වෙසක්" උත්සවය 19 වැනි වරටත් 2020 මැයි මස 07, 08, 09, සහ 10 යන දින තුළ පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී. එම උත්සවයේ පහත ඉදිරිපත් කිරීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**1. වෙසක් පහන් කූඩු - (කේවල /ආයතනික සහ පාසල්)**
**2. පාසල් චිත්‍ර - (ප්‍රාථමික/ කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ)**

**හොඳම නිර්මාණකරුවන් සඳහා මුදල් ත්‍යාග සහ සහතික පත්‍ර පිරි නැමේ.**

**අයදුම්පත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන කාර්යාලය වෙතින් හෝ www.acbc.lk/application / වෙබ් අඩවියට යොමු වීමෙන් ලබා ගත හැක.**

**අයදුම්පත් භාර ගැනීම**
- **චිත්‍ර නිර්මාණය සමග අයදුම්පත් 2020 අප්‍රේල් 10 දින දක්වාත්,**
- **වෙසක් පහන් කූඩු නිර්මාණයට අදාල දළ සැලැස්ම සමඟ අයදුම්පත් 2020 අප්‍රේල් 30 දක්වාත් භාර ගැනේ.**

**අයදුම්පත් පහත ලිපිනයට තැපෑලෙන් හෝ පැමිණ භාර දිය හැකිය.**

**විමසීම්: වෙසක් පහන් කූඩු - තුෂාර දිලුම් වාහලතන්ත්‍රී - 070-5669956**
**පාසල් චිත්‍ර - ඉෂාන් බුද්ධික එදිරිසූරිය - 071-4018383**

**ලේකම් - බෞද්ධාලෝක වෙසක්: සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය,**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. දුරකථන අංක - 011-2691695/ 2688517**

**විද්‍යුත් තැපෑල: acbc380@gmail.com** **වෙබ් අඩවිය: www.acbc.lk**



# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාණන්ගේ අභිමානවත් චින්තනයන් මල්පල ගන්වමු!

ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පා පහසේ ස්පර්ශය තෙවරක් ම ලැබූයේ මේ ලක් පොළොවයි. උන් වහන්සේගේ බුද්ධ අධිෂ්ඨානයන් අනුව උතුම් ශ්‍රී සද්ධර්මයේ මෙන්ම උන්වහන්සේ හා සමාන අතිශය පූජනීය වස්තූන්ගේ පුණ්‍යවන්ත හිමිකරුවා වන්නේ ද අප ලක් මාතාවයි. අතීතයේ පටන් එකී ලක් මාතාව වනසන්නට වෙර දරන වුන්ට එය සිහිනයක් ම පමණක් බවට පත් කරමින් අප ලක් මෑණියන් සුජාත පුතුන් ජනිත කොට ඇත්තේ එහෙයිනි. අතීතයේ තතු හොඳින් හඳුනන සැබෑ සිහළුන් එය එක හෙළාම අනුමත කරන බව නොඅනුමානය.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් යනු, මේ උතුම් ලක් දෙරණත්, අභීත හෙළ ජාතියත්, නිර්මල සම්බුදු සසුනත් විනාශ කරන්නට මාන බැලූ පරදේසක්කාරයන් මඩින්නට ලක් මෑණියන් ජනිත කළ එවන් සුජාත පුත්‍ර රත්නයකි. වර්ෂ 1864 සැප්තැබර් මස 17 වන දින දොන් කරෝලිස් හේවාවිතාරණ හා මල්ලිකා හේවාවිතාරණ යන පුණ්‍යවන්ත දෙමාපියනට දාව දොන් ඩේවිඩ් හේවාවිතාරණ නම් අසහාය පුත්‍රරුවන බිහිවිය.

එකල පැවැති මිෂනාරී බලපෑම් හමුවේ අන් සැමට මෙන් එතුමන්ට ද ලැබුණේ ඩේවිඩ් යන විජාතික නාමයයි. එපමණක් ද නොව එවකට බෞද්ධ පාසල් නොවූ බැවින් එතුමන්ට අධ්‍යාපනය හැදෑරීම සඳහා යන්නට ලැබුණේ ද ක්‍රිස්තියානි පාසල් වෙතය. එකී පාසල් තුළ ක්‍රිස්තියානි ආගම හැරෙන්නට වෙනත් ශාස්ත්‍රයක් හැදෑරීමට අවස්ථාව නොවූ හෙයින් එතුමන්ට බයිබලය පිළිබඳවත්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳවත් මනාකොට ඉගෙනීමට අවස්ථාව උදාවිය. එසේ වුවත් දෙමාපියන්ගෙන් ලද ආභාසයත්, සිය නිවස තුළ පැවති බෞද්ධ පරිසරයත් හේතුවෙන් එතුමන්ව එවකට ව්‍යාප්තව පැවැති මිෂනාරීන් දෙසට නතු කරලීමට නොහැකිවිය.

වර්ෂ 1873 දී කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණ පිහිටුවීමෙන් පසු, එතුමන් හට එහි අධිපතීත්වය හෙබවූ පූජනීය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන්ගේ සෙවණෙහි සිංහල පාලි භාෂා සහිත බෞද්ධ දර්ශනය පිළිබඳව ගැඹුරින් හදාරන්නට භාග්‍ය හිමි විය. අධ්‍යාපන කටයුතු නිමවීමෙන් පසු රජයේ ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳුණද ජාතික, ශාසනික වැඩකටයුතුවලට දැඩිලෙස සිත යොමු වීමත් නිසාම රැකියාවෙන් ඉවත් විය.

එවකට මිෂනාරී බලපෑම් හමුවේ සිංහලයන් අන්ත අසරණභාවයට පත් විය. එය කොතෙක්දැයි කියතොත්, ඇතැමෙක් එම බලපෑම් ඉවසාගත නොහැකිව බෞද්ධාගම අත්හැර ක්‍රිස්තියානි ආගම වැළඳගන්නටද පෙළඹුණු. සුදුවතින් සැරසී තෙල් මල් රැගෙන බුදුන් වඳින්න යන බෞද්ධයින් හට නොයෙකුත් හිරිහැර කරදරයන්ට මුහුණ පාන්නට සිදුවිය. රෙද්ද බැනියම ඇන්දවුන් සමච්චලයට ලක් විය. පරදේශක්කාර චින්තනයට නතු වී ඇඳුමින් පැළඳුමින් මෙන්ම සිතුවිලිවලින් පවා මිනිසුන් වෙනස් වන්නට විය. එකී පරාධීනත්වයෙන් සිංහල බෞද්ධයන් බේරා ගන්නට ජාත්‍යාලයෙන් කකියන ලෙසින් යුතු වූ එතුමන් නිර්භයව ඉදිරියට පැමිණුනි. සෙන්පති ඕල්කට්තුමන් සමඟ එක්ව කොළඹ පරමවිඥානාර්ථ සමාගමේ කටයුතුවල නිරත වූ එතුමා "සරසවි සඳරැස" පුවත්පත ඔස්සේ සිංහල බෞද්ධයාගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ මූලික අඩිතාලම දමන්නට විය. මිෂනාරී චින්තන රටාවෙන් තමන් වෙත පැටවුණු ඩේවිඩ් යන සංකර නාමය ඉවතට විසි කළ මේ උදාර තරුණයා, එතැන් පටන් ධර්මපාල යන නාමය භාවිතා කළහ.

ගිහි ජීවිතයෙන් ඈත්ව මහජන සේවයටත්, ශාසනික සේවයටත් තම දිවියම කැප කළ මෙතුමන් හට ජනතාව විසින් ඉමහත් ආදරයෙන් පුදන ලද "අනගාරික"නැමැති පූර්ව පදයත් සමඟ එතුමන් අනගාරික ධර්මපාල නමින් ප්‍රකට විය.

තම සිත කය වෙහෙසා දහවල් දුක් විඳිමින් කැප වුණු එතුමන් කිසි කලෙකත් භාගෙට වැඩ සිදු කලේ නැත. **"කරතොත් කරපන් හරියට - බැරිනම් පලයන් අහකට"** යන ආප්ත පදය නිරන්තරයෙන් තම දිවග ලෙළදුන් එතුමන්ගේ එකම අභිප්‍රාය වූයේ, කළ යුතු කුමන වැඩක් වුවද නිවැරදිව අවංකව සිදු කිරීමයි. එතුමන් හට සියළු ජය ග්‍රහණයන් ලබා ගන්නට හැකි වූයේ ද එනිසාම ය.

ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් බෞද්ධයෙකු විසින් දැක සිත පහදවා ගත යු ස්තාන ලෙස උන් වහන්සේ උන් ලුම්බිණි පුදබිම, දස බිම්බරක් මරසෙන් පරදා උත්තරීතර බුද්ධත්වයට පත් බුද්ධගයා පුදබිම, දම්සක් නද පැතිර වූ ඉසිපතන මිගදාය නම් පින් බිම හා සියළු සංස්කාරයන්ගේ අනිත්‍යතාවය ලොවට පසක් කරමින් පරිනිර්වාණයට පත් කුසිනාරා නුවර පින්බිම දේශනා කොට ඇත. උන්වහන්සේ වදාළ පරිදිම, අද අපි මහත් වූ ශ්‍රද්ධා ගෞරව පෙරදැරිවම ඒ උතුම් පුණ්‍ය භූමි වන්දනා කරමින් අප්‍රමාණ පින් රැස් කරගනිමින් සිටී. නමුදු අපට එකී පුණය භූමියට මග විවර කරදුන් ශ්‍රීමත් අනගාරික ධර්පාලතුමන් පිළිබඳව අපේ හදවත් තුළ පුංචි හෝ මතකයන් ඇත්ද යන්න අවංකවම තම හදවත්වලට තට්ටු කොට බැලිය යුතුය. දඹදිව වැඩ ඉන්නා වූ අපගේ ස්වාමීන් වහන්ස්ලාට පින් සිදුවන්නට දඹදිව සංචාරය අවසන් කොට අප රටට පැමිණීමට මත්තෙන් කොතකනදී හෝ එතුමන් මතක් කොට පින් අනුමෝදන් නොකරන්නට, එකී මතකයක්වත් අපට නොමැති වීම පිළිබඳව අප ලැජ්ජා විය යුතු නෙවේ ද? එකී පුණ්‍ය භූමියට පා තැබූ විට හෝ සිතින් සිහිකොට ඇඟිලි තුඩු එක්කොට දෑත් ඔසවා

දැන් අප සිදු කළ යුත්තේ කුමක් ද? එකී අභිමානවත් චින්තනය දකිමින්, කියවමින්, වර්ණනා කරමින් අවසන, හකුලා පැත්තකින් තැබීම ද? මෙතෙක් සිදු කළේ නම් එයමය. එය එසේ වූ නිසාම අද වන විටත් අපගේ අභිමානවත් හෙළ දේශය, අභිමානවත් හෙළ ජාතිය, පිනෙන් පහළ වූ අතිශය නිර්මල දහමත් අපෙන් ගිලිහෙමින් ඇත.

වන්දනා කරන වාරයක් වාරයක් පාසා, ඒ සඳහා මග විවර කරදුන් ධර්මපාලතුමන්ට පුණ්‍යානුමෝදනා කළ යුතුවේ. කළ ගුණ දන්නා ජාතියක් වශයෙන් එය අපගේ යුතුකමක් නොව වගකීමක් ලෙස සිතිය යුතුය. එය එසේ වුවහොත් මුළු විශ්වයේම ආශීර්වාදය අපට හිමිවන බව නොඅනුමානය.

**අනගාරික ධර්මපාලතුමන්ගේ චින්තනයෙන් බිඳක් පහත පරිදි වේ.**

- සිංහලයා සිංහලයෙකු මෙන් නිර්භීත විය යුතුය.
- අවුරුදු 2500 ක් වැනි දීර්ඝ කාලයක් බෞද්ධාගම රැකගත් එකම ජාතිය සිංහල ජාතියයි.
- නියම සිංහලයා දැකිය හැක්කේ සිංහල බෞද්ධයෙකු තුළින්මයි.






- සෑම සිංහලයෙකුම අවංක විය යුතුය, දක්ෂ විය යුතුය.
- සිංහලයන් නිකන් නොසිට, රැස් කළ යුතුය.
- සිංහලයා ගොවිකම හා නොයෙක් ශිල්ප උගත යුතුය.
- සිංහලයන් තුළ දක්නට ඇති පැරණි උතුම් සංස්කෘතිය ආරක්ෂා කර ගත යුතුය.
- සෑම සිංහලයෙකුම තම රට ජාතිය ආගමට සේවය කළ යුතුය.
- සිංහලයන් විදේශීය සිරිත් විරිත් අන්ධානුකරණයෙන් වැළඳ නොගත යුතුය.
- සිංහලයන් පිරිහීමට හේතුව අසමගිකමයි. එබැවින් නිතර සමගියෙන් සිටිය යුතුය.
- බෞද්ධාගම ලෝකය පුරා පැතිරවිය හැකි එකම රට මේ සිංහල දේශයයි.
- භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි, දෙමළ ප්‍රංශ, ජර්මන් ආදී විදේශ භාෂා කීපයක් දැනගත යුතුය.
- භික්ෂූන් වහන්සේලා උගත් සිල්වත් අය විය යුතුයි.
- සිංහල නායකයන් නිතර ආදර්ශවත් විය යුතුය.


දැන් අප සිදු කළ යුත්තේ කුමක් ද? එකී අභිමානවත් චින්තනය දකිමින්, කියවමින්, වර්ණනා කරමින් අවසන, හකුලා පැත්තකින් තැබීම ද? මෙතෙක් සිදු කළේ නම් එයමය. එය එසේ වූ නිසාම අද වන විටත් අපගේ අභිමානවත් හෙළ දේශය, අභිමානවත් හෙළ ජාතිය, පිනෙන් පහළ වූ අතිශය නිර්මල දහමත් අපෙන් ගිලිහෙමින් ඇත. ලක් මාතාව මෙතෙක් සැනසුණේ නම්, ඒ මිල කළ නොහැකි වූ රත්නයන් නිසාමය. ලක් දූ පුතුන් වන අපට, එකී මාතාවගේ වැනසීම සිහිනයකිනුදු සිතන්නට නම් නොහැකිය.

දැනුදු අපි ප්‍රමාද යැයි නොසිතමු. එසේ නම් අනාගත දරු පරපුරට අප ඒ අභිමානවත් චින්තනය උරුම කර දෙන්නට අද සිට හෝ වෙහෙස වෙමු. පරගැති චින්තනයෙන් අපේ දරුවන් මුදවාගෙන, අපගේ උතුම් සංස්කෘතිය ආරක්ෂා කරගන්නට අවැසි ශක්තිය ඔවුනට ලබාදෙමු. සසරේ පිනට උරුම වූ මේ උතුම් දහම් අරුත ඔවුනට වටහා දෙමු. සිංහලයන්ගේ අභිමානය, ඔවුන් කළ දේ හා ඔවුන්ට කළ හැකි දේ මේ යැයි යන්න පහදා දෙමු. ලක් මාතාව සලසා ලන්නට ඔවුන් නිවැරදි මගට මෙහෙයවමු.

එයම, මේ උතුම් මාතෘ භූමිය, ප්‍රෞඪ ජාතිය, නිර්මල සම්බුදු සසුන උදෙසා ස්වකීය දිවියම දියකර හැරි බෝධිසත්ත්ව ගුණෝපේත ශ්‍රීමත් අනගාරික ධර්පාලතුමන් තම ආත්මීය සැනසීමට අනුගත වෙමින් වයස අවු. 66 දී සිරි දේවමිත්ත ධම්මපාල නමින් පැවිදි දිවියට පත්ව වර්ෂ 1933 දී අප්‍රේල් මස 29 වෙනි දින අපවත් විය.

## දම්පල් චරිතයේ ප්‍රධාන සිද්ධි

1864 සැප්තැම්බර් 17 - උපත
1876 පාසල් නිවාසයේදී - කුරුල්ලන් මරණ මිෂනාරී ගුරුවරයා නිසා කලකිරීම.
1880 මැයි - හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමාගේ දේශනය ඇසීම.
1883 ජනවාරි - කොටහේනේ කලහයෙන් කම්පාවීම.
1884 පරම විඥාර්ථ සමාගමට බැඳීම.
1885 “ඩේවිඩ්” යන නාමය අතහැර ධර්මපාල වීම හා අනගාරික ව්‍රතයට පිවිසීම.
1891 මැයි - මහාබෝධි සමාගම ඇරඹීම.
1894 සැප්තැම්බර් - බුද්ධගයා අරමුදල ඇරඹීම.
1901 බුද්ධගයා භූමියෙන් බිම් කැබැල්ලක් ලබා ගැනීම.
1902 බරණැස ඉසිපතනයෙන් භූමි භාගයක් ගැනීම.
1906 මැයි - “සිංහල බෞද්ධයා” පත්‍රය ඇරඹීම.
1906 හිනිදුම හා රාජගිරියේ බෞද්ධ පාසැල් ඇරඹීම.
1912 ලංකාව පුරා දේශන චාරිකාව.
1915 1920 කල්කටාවේ නිවාස අඩස්සියට පත්ව සිටීම.
1916 කල්කටා විහාරයට ඉඩම ගැනීම.
1918 කල්කටා ධර්මරාජ විහාරයේ වැඩ පටන් ගැනීම.
1920 විහාර කර්මාන්තය නිම කොට මහ පෙරහරක් පැවැත්වීම.
1923 ෆොස්ටර් රොබිස්සන් අරමුදල පිහිටුවීම.
1925 නිව්යෝර්ක් නගර ශාලාවේ ප්‍රසිද්ධ දේශනය.
1926 ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය පිහිටුවීම.
1928 බරණැස මූලගන්ධකුටි විහාර කර්මාන්තය ඇරඹීම.
1930 මූලගන්ධකුටි විහාර කර්මාන්තය නිම කිරීම.
1931 ධර්මපාල භාරකාර මණ්ඩලය පත්කිරීම හා දඹදිව බලා ලංකාවෙන් නික්මීම.
1931 ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වීම.
1933 ජනවාරි 16 - උපසම්පදා අධිශීලය ලැබීම.
1933 අප්‍රේල් 29 - නිදන ප්‍රාප්තිය.



# අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි

සම්බුද්ධ ශාසනය රඳා පවතින්නේ සිල්වත්, ගුණවත්, උගත් භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරීත්වය මතයි. එලෙස සම්බුද්ධ ශාසනය රැක ගැනීමට මෑත යුගයේ ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ යතිවරයාණන් වහන්සේ නමක් ලෙස අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමිපාණන් වහන්සේ හඳුන්වා දිය හැකි ය.

කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ආසන්නයේ, රයිගම් කෝරළයේ රේරුකාන නම් ගම පිහිටා ඇත. එහි ජීවත් වූ දොන් බස්තියන් ද පවුලිස් ගුණවර්ධන මහතාට සහ මුණසිංහගේ පොඩි නෝනා මාතාවට දාව වර්ෂ 1897 ජූලි මස 19 වැනි දින රූබෙල් ගුණවර්ධන උපත ලබන ලදී. උන්වහන්සේගේ ගිහි කාලයේ නම වන්නේ, රූබෙල් ගුණවර්ධන යන නාමයයි. රූබෙල් ගුණවර්ධන අධ්‍යාපනය ලබන ලද්දේ වීදියගොඩ පාසලෙනි. ක්‍රි.ව. 1906 ජනවාරි 08 වනදා පාසල් අධ්‍යාපනය නතර කර රූබෙල් ගුණවර්ධන පැවිදි දිවියට ඇතුළත් විය. පැවිදි වීමෙන් පසුව රේරුකානේ චන්දවිමල යන නමින් හඳුන්වනු ලබන ලදී. එකල සාමණේරයන් වහන්සේලා විනයාලංකාර හිමියන් විසින් බුරුම රටට කැඳවාගෙන යන ලදී. සිංහල භාෂාව හැර කිසිම භාෂාවක් නොදැන බුරුම රටට වැඩි සාමණේරයන් වහන්සේලා පිරිසට මුල දී අධ්‍යාපනය ලැබීම කෙසේ වුවත් කතා බහ කිරීම පවා අපහසු විය. එහෙත් උන්වහන්සේලා ටික කාලයක් තුළ බුරුම භාෂාව ඉතා හොඳින් ඉගෙන ගන්නා ලදී. ඒ අතර සූත්‍ර, විනය හා අභිධර්මය ඉතා හොඳින් ප්‍රගුණ කරන ලදී. ත්‍රිපිටකය පමණක් නොව තම භික්ෂු ජීවිතයට අවශ්‍ය වන්නා වූ ඇවතුම් පැවතුම් මෙන් ම භාවනාව ද හොඳින් ප්‍රගුණ කරන ලදී. බුරුමයේ ඉතා දැන උගත් භික්ෂූන් වහන්සේලා වෙතින් අධ්‍යාපනය ලද මේ සාමණේරයන් වහන්සේලා අතර රේරුකානේ හිමියන් ඉතා දක්ෂ අයුරින් ත්‍රිපිටකය පමණක් නොව බුරුම භාෂාවෙන් ලියැවී ඇති අභිධර්ම ග්‍රන්ථ ආදිය පවා හොඳින් ඉගෙන ගන්නා ලදී. වසර දහයක් පමණ බුරුමයේ අධ්‍යාපනය ලබා උන්වහන්සේ බුරුම රටේ ධම්මිකාරාම සීමාවේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලබාගන්නා ලදී.

උන්වහන්සේ ඉතා වැදගත් බෞද්ධ ග්‍රන්ථ රැසක්ම රචනා කොට ඇත. උන්වහන්සේ ලියූ බෞද්ධ පොත් පත් විනය ග්‍රන්ථ, අභිධර්ම ග්‍රන්ථ, භාවනා ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ ආදී වශයෙන් වර්ග කොට දැක්විය හැකි ය. ඒ ඒ විෂයන්ට අදාළව පරතෙරට ගිය අපූර්ව ධර්මධරත්වයක් උන්වහන්සේට තිබෙන ලදී. එමෙන් ම ගුණ බර වූ විනය ධරත්වයක් උන්වහන්සේ ස්වභාවයෙන්ම ගොඩනඟා ගෙන තිබෙන ලදී. බලන්ගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් රේරුකානේ චන්දවිමල හිමියන් පිළිබඳව දක්වන ලද්දේ අපමණ ගෞරවයකි. උන්වහන්සේගේ ධර්මධරත්වය පිළිබඳව ආනන්ද මෛත්‍රී හිමියන් වරක් ප්‍රකාශ කොට ඇත්තේ, "රේරුකානේ නායක හාමුදුරුවන්ගේ

බණ පොත් ටික හොඳින් කියෙවුවොත් ඒ තැනැත්තා හොඳ ධර්මධරයෙක්. ධර්මඥයෙක් වෙනවා" යැයි යනුවෙනි. ඒ ප්‍රකාශය තුළින් ද උන්වහන්සේ සතුව පැවති ධර්මධරත්වය පිළිබඳව මනාව පැහැදිළි වේ. උන්වහන්සේ විසින් රචනා කරන ලද බෞද්ධ ග්‍රන්ථ අතර පෙහෙවස් සමාදන් වූ උපාසක උපාසිකාවන් උපෝසථ අෂ්ටාංග ශීලය රකිමින් කාලය ගත කළ යුතු ආකාරය ගැන උපදෙස් ලබාදෙන පොහොය දිනය ග්‍රන්ථයත්, නියම බෞද්ධයාට අවශ්‍ය මූලික දැනුම ලබා ගැනීමටත්, බෞද්ධයෙකු වශයෙන් හැසිරීමට අවශ්‍ය හැදියාව ලබා ගැනීමට උපකාරී වන බෞද්ධයාගේ අත්පොත ග්‍රන්ථයත්, දස පාරමිතා පිළිබඳ දීර්ඝ විස්තරයක් කෙරෙන පාරමිතා ප්‍රකරණය ග්‍රන්ථයත්, අභිධර්මය ඉගෙන ගැනීමට කැමති අයට ඉහළ දැනුමක් ලබා දෙන අභිධර්ම මාර්ගය ග්‍රන්ථයත් ඉතාම ප්‍රයෝජනවත් ග්‍රන්ථ කිහිපයකි. මීට අමතරව උන්වහන්සේ රචනා කළ ග්‍රන්ථ වශයෙන් සූවිසි මහා ගුණය, මංගල ධර්ම විස්තරය, පොහොය දිනය, බුද්ධ නීති සංග්‍රහය, බෝධිපාක්ෂික ධර්ම විස්තරය, නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති කර්මය යන ග්‍රන්ථයන් ද හඳුන්වාදිය හැකි ය. මෙම ග්‍රන්ථ කෙතරම් නම් වැදගත් ද යන්නට හොඳම සහතිකය වන්නේ, උන්වහන්සේට විශ්වවිද්‍යාලයන් තුළින් පිරිනමනු ලැබූ උපාධි සහතිකයි. ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පාලි, සංස්කෘත, සිංහල භාෂා පිළිබඳ හසළ දැනුමක් ඇති අයට දෙනු ලබන උපාධියක් වන "සම්මාන පණ්ඩිත" උපාධිය උන්වහන්සේට පිරිනමන ලදි. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මගින් අභිධර්මය පිළිබඳ මහාචාර්ය පදවියක් පිරිනමන ලදි. එම විශ්වවිද්‍යාලය මගින් ම සාහිත්‍ය චක්‍රවර්තී උපාධියත් පිරිනමන ලදි. අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය මගින් ප්‍රවචන විශාරද සම්මාන උපාධිය උන්වහන්සේට ලැබෙන ලදි. 1995 වර්ෂයේ දී අමරපුර මහා සංඝ සභාව මගින් අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන යන ගෞරව නාමය ද උන්වහන්සේ වෙත පිරිනමා ඇත.

රේරුකානේ චන්දවිමල හිමියන් තමාගේ ඉගෙනීම පිළිබඳව වරක් ප්‍රකාශ කොට ඇත්තේ, "මම ඉගෙනීම් කළේ පොත් පත් ලිවීමේ අදහසින්වත් අනුන්ට බණ කීමේ අදහසින්වත් නොවේ. අපේ සම්මෝහය දුරු කර ගැනීමටයි." යනුවෙනි.





**රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් ලියන ලද පොත්**

උන්වහන්සේ සම්මෝහය දුරු කර ගන්නට ඇතැයි කාටත් සිතිය හැකි ය.

උන්වහන්සේ තමන්ට කෙතරම් ගරුනාම, නම්බුනාම, උගත්කම් තිබුණ ද ගත කරන ලද්දේ ඉතාමත් නිහතමානී, චාම්, අල්පේච්ඡ, දිවිපෙවෙතකි. බුදුදහම තම දිවියට ළංකර ගත් සුපේශල ශික්ෂාකාමී දිවිපෙවෙතක් ගත කළ උන්වහන්සේ අපවත් වීමට පෙර ස්වකීය ආදාහනය පවා ඉතාමත් සරල ලෙස සිදු විය යුතු බවට උන්වහන්සේ සඳහන් කොට ඇත. සෑම සංස්කාරයක් ම අනිත්‍ය බව ලෝකයාට පසක් කර දෙමින් උන්වහන්සේ වර්ෂ 1997 ජූලි මස 04 වෙනි දින සිහියෙන් යුතුව අපවත් වෙන ලදි

වර්තමානයේත් විහාරස්ථානවල හා ආරණ්‍ය සේනාසනවල ධර්ම මාර්ගයේ ගමන් කරන්නා වූ ස්වාමීන් වහන්සේලා රේරුකානේ චන්දවිමල නායක හිමිපාණන්ගේ පොත් නිරන්තරයෙන් පර්ශීලනය කරනු ලබයි. ගිහි පැවිදි දෙපක්ෂයම රේරුකානේ චන්දවිමල හිමියන්ගේ පොත් පත් තුළින් බොහෝ දේ තම ජීවිතයට ලබා ගනී. පොත් පත් රචනා කළා පමණක් නොව ඉන් ඔබ්බට උන්වහන්සේ සසර දුකින් මිදීමට ඇතැයි යන්න බොහෝ දෙනාගේ විශ්වාසයයි.

**කේ.වී.ඩී. අරුණි සසංගිකා**



# මංගල සූත්‍රයෙන් පෙන්නුම් කර ඇති සමාජ පසුබිම අදට ගැළපේ ද?

මංගල සූත්‍රය යනු කුමක් ද? මංගල යනු කුමක්දැයි පැනනැඟුණු ප්‍රශ්නය මනුලොවින් දෙව්ලොව දක්වාත්, එතැනින් බඹලොව දක්වාත් පැතිරෙන්නට විය. ඒ අවස්ථාවේ තව්තිසා වැසි දෙවිවරු බුදුන්වහන්සේ කරා පැමිණ මංගල නම් කුමක්දැයි ප්‍රශ්නය විසඳා ගැනීමට හේතුවිය.

මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රය දේශනා කළ සේක. මේ සූත්‍රයේ මංගල කරුණු අටතිසෙන් දෙතිසක් ලෞකික ජීවිතයට සම්බන්ධ ය. සයක් ලෝකෝත්තර ජීවිතයට සම්බන්ධ ය. මංගල යන්නෙහි තේරුම උභය ලෝකාර්ථ සංසිද්ධියයි. දෙලොවම අභිවෘද්ධියයි යනුවෙන් දේශනා කර දෙව් මිනිස් අතර තිබූ ප්‍රශ්නය විසඳා වදාළ සේක.

අපගේ ජීවිතය හා ගත් කල මීට වසර දෙදහස් පන්සිය පනස් ගණනකට පෙර බුදුන් වහන්සේ දේශනා කළ මංගල සූත්‍රයෙහි පෙනෙන සමාජ පසුබිම ඒ කාලයටත් වඩා වර්තමානයට බෙහෙවින්ම ගැළපෙන බව අපහට පැහැදිලිව පෙනෙනවා. සුඛිත මුදිත දියුණු සදාචාර සම්පන්න දැහැමි සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පසුතලයක් මංගල සූත්‍රයෙහි එන සෑම මංගල කරුණක්ම පරීක්ෂා කර බැලීමේදී වටහා ගත හැකියි.

අප ජීවත් වන සමාජය පුද්ගල සමූහයකගේ එකතුවයි. එසේනම් යහපත් විය යුතුයි. එවිට මුළු සමාජයම යහපත් ධාර්මිෂ්ඨ සමාජයක් බවට පරිවර්තනය වේ. මේ පුද්ගලයා වැරදි සහගත වුවහොත් අසාධාරණ අධාර්මිෂ්ඨ වේ. එවිට යම් කිසි පුද්ගලයෙකු සතු අයිතීන් සේම සමගිය සමාදානය ද නැතිව ගොස් අසීලාචාර සමාජ රටාවක් ගොඩනැගේ. එනිසා නිවහල් නිවැරදි සදාචාර සම්පන්න දැහැමි සමාජ රටාවක් ගොඩ නැගීමට අවශ්‍ය පසුතලයක් අප තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ

දේශනා කළ මංගල සූත්‍රය පුරාම පැතිර පවතී. එහි සඳහන් අටතිසක් වන මංගල කරුණු සියල්ලෙන්ම එය මනාව පිළිබිඹු වේ.

එහි මුල්ම මංගල කරුණ වනුයේ බාලයන් ඇසුරු නොකිරීම පිළිබඳවයි. බාලයන් යනුවෙන් අදහස් කරන්නේ හොඳ නරක, දහම අදහම, පව් පින් පිළිබඳවත් මව්පිය වැඩිහිටි හා පිදිය යුත්තන් ගරු කළ යුතු බව නොහඳුනන, තමන්ගේ මෙන්ම අනුන්ගේ ද දෙලොව දියුණුව හා යහපත වනසාලන අණුවනයන් බව අපට පැහැදිලි ය. බාලයන් නිතරම සිතනුයේ අයහපත් පාපකාරි අසාධාරණ අදැහැමි දෙයයි. ඒ අයගේ වචනයන් හා ක්‍රියාවන් ද ඒ පිදීමය. අප වර්තමාන සමාජයේ එවන් අය අපමණයි එනිසාම සොරකම, බොරුව, කේලාම් කීම, සුරාව, සූදුව, වංචාව, රැවටීම, දූෂණ වැනි අසාධාරණකම් සහ දුසිරිත්වලින් මුළු සමාජයම පරිහානියට පත්ව ඇත. දැහැමි සමාජයක් බිහිකිරීමට නම් බාලයන් ඇසුරු කිරීමෙන් වැළකිය යුතුව පවති. දැහැමි සමාජ රටාවක් සඳහා තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ දියුණුවේ දොරටුවක් ලෙස පෙන්වා දී ඇති නැණවතුන් ආශ්‍රය කිරීම වැදගත් වේ. ඔවුන්ගේ සිතුවිලි වචන මෙන්ම ක්‍රියාවන් ද දැහැමි නිවැරදි යහපත් ඒවායි යනු අපට පැහැදිලි වෙනවා. එසේම දැහැමි සමාජයක් සඳහා බාලයන් ඇසුරු නොකොට නුවණැත්තන් ඇසුරට පුරුදු පුහුණු විය යුතුයි.

පිදිය යුත්තන් පිදීම හා ගරුකළ යුත්තන් ගරු කිරීම මංගල කරුණු වේ. බුදු, පසේබුදු, මහරහත් වහන්සේලා එසේම මහණ බමුණන්, දෙමව්පිය ගුරුභවතුන්, වැඩිහිටි අය ගරු කළ යුතු උත්තමයෝයි. එහෙත් මෙය අප රටේ, අප සමාජයේ සාරධර්ම පිරිහී ගොස් ඇති බව නිතිපතා අපට පෙන්නුම් කරන දෙයකි. වර්තමාන සමාජයේ පාසල් සිසුන් පිදිය යුත්තන් පිදීමට හා ගරු කළ යුතු අයට ගරු කිරීමට අකැමැති බව අපට පෙනෙයි. බටහිර සිරිත් විරිත් අනුගමනය කරන සමාජයක දේශීය පැරණි සිරිත් විරිත් හා සාරදර්ම පිරිහීයාම අරුමයක් නොවේ. බාල පරපුරට මෙම සාරධර්ම පුරුදු පුහුණු කිරීම කළ යුතු යුගයක් වර්තමානයේ උදාවී ඇති බව අපට පැහැදිලි ය.

සත්පුරුෂ ඇසුරක් ඇති සුදුසු පෙදෙස්වල විසීම හා පෙර පින් ඇති බවද දියුණු යහපත් දැහැමි සමාජයකට අත්‍යවශ්‍යම ය. හික්මීම අපි සැමදෙනාටම තිබිය යුතු සාරධර්මයකි. පුදබිම් ආශ්‍රය දහම් පාසල් ඇසුරින් ඉගෙනීම හික්මීම අප බාල පරපුරට නිතිපතා ලැබේ. හික්මීම නොමැති තැන සදාචාරයක් ද නැත. යහපත් වචනය සුචරිතවත් දියුණු සදාචාර සම්පන්න දැහැමි සමාජයක තිබිය යුතු සාරධර්මයකි. වර්තමානයේ බොහෝ දෙනකුගේ මුවින් පිටවනුයේ නපුරු රළු වචනයි. පිරිසක් එකතු වූ තැන හිස් වචන, ඕපාදූප කථා කිරීම නිතර සිදුවන්නකි. නපුරු වචන මුළු ලොවක් ම විනාශ කර දැමිය හැකි ය. එබැවින් යහපත් සුචරිතවත් වචනය මුළු සමාජයටම ආශීර්වාදයක් බව ද බුදුන් වහන්සේ දේශනා කරන ලදී.

යුතුකම් ඉටුවන මව්පිය උපස්ථානය හා අඹුදරුවන් පෝෂණය සදාචාර සම්පන්න ධර්මිෂ්ඨ

**දැහැමි සමාජයක් බිහිකිරීමට නම් බාලයන් ඇසුරු කිරීමෙන් වැළකිය යුතුව පවති. දැහැමි සමාජ රටාවක් සඳහා තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දියුණුවේ දොරටුවක් ලෙස පෙන්වා දී ඇති නැණවතුන් ආශ්‍රය කිරීම වැදගත් වේ. ඔවුන්ගේ සිතුවිලි වචන මෙන්ම ක්‍රියාවන් ද දැහැමි නිවැරදි යහපත් ඒවායි යනු අපට පැහැදිලි වෙනවා.**

සමාජයකට අවශ්‍ය සාරධර්මයකි. සමාජයේ මෙවැනි යුතුකම් හරියාකාරව ඉටු නොවීමේ හේතුවෙන් වැඩිහිටි නිවාස, ළමා නිවාස, අනාථ නිවාස බහුල වෙමින් පවතී. මැනවින් සිප්සතර උගන්වා සුදුසු කල්හි ආවාහ විවාහ කටයුතු ඉටුකර දී මහලු වියට පත් වූ පසු දෙමාපියන් වැඩිහිටි නිවාසවලට වී අන් අයගෙන් යැපීම ද, සැමියාගේ හව්හරණක් නැති බිරියන් අසරණව ගණිකා වෘත්තියෙහි පවා යෙදෙන අවස්ථා ද, ඇතැම් කුඩා දරුවන් සිඟමන් දිවි ගෙවන අවස්ථාද අපට නිතර අසන්නට දකින්නට ලැබෙන සුලභ සිදුවීම් බවට අද පත්ව ඇත. මේවා සිදුවන්නේ තම තමන්ගේ යුතුකම් හරියාකාරව ඉටු නොවීමේ විපාක වශයෙනි. තමන්ගෙන් ඉටු විය යුතු

යුතුකම් වගකීම් වශයෙන් සලකා මැනවින් අප ඉටු කළ යුතුයි.

නිරවුල් කර්මාන්ත වර්තමානයේ සිදු කරන ඇතැම් වෙළහෙළඳාම්, ගොවිතැන්, ව්‍යාපාර කටයුතු අවුල් සහගත බව කීවොත් නිවැරදියි. හේතුව අකටයුතු වෙළඳාම්, ඒ හැම කටයුත්තකටම සම්බන්ධයි. මේවායින් පස් පවු, දස අකුසල් සිදුවේ. අධර්මයෙන් ජීවිතය ගෙවීම වංචාවෙන් රැවටීමෙන් අයුතු අසාධාරණ ලෙස දිවිගෙවීම හා බාහිර දියුණුව ඇතිකර ගැනීමට වර්තමාන සමාජ වෙහෙස දැරීම වැරදි කටයුතුයි. එබැවින් නිරවුල් කර්මාන්ත හා නිරවද්‍ය කර්ම අප බාල පරපුරට දායාද කොට දීම වැඩිහිටියන්ගේ යුතුකම හා වගකීම වේ. දැහැමි නිවැරදි ගොවිකටයුතු හා වෙළෙඳාම් ව්‍යාපර පැවැත්වීම ආදිය නිරවුල් කර්මාන්ත ලෙස සැලකිය හැකියි.

දන්දීම තුළින් දුප්පත්කම, දිළිඳුකම නැති වේ. පුද්ගලයන් පස්පවු හා දස අකුසල් අසාධාරණ සැහැසිකම් කරනුයේ දිළිඳුකම නිසා ය. එබැවින් රටක් වශයෙන් ගත් කල රටවැසියාට සහනාධාර වෙනත් දීමනා බැංකු ණය වැනි සහන තුළින් හා වෙළෙඳාම් කටයුතු හා ව්‍යාපර වැනි දෑ ආරම්භ කර ගැනීම සඳහාත් අලුතින් පවත්වාගෙන යාම දිරි දීමනා ලබා දී, රැකියා ලබාදීම ආදියෙන් දිළිඳු බව පහ ව යනු ඇත. එවිට පුද්ගලයෝ දැහැමි දිවිපෙවෙතක් ගත කරන්නවුන් බවට පත්වෙති. එනිසාම සුඛිත මුදිත සදාචාර සමාජයක් ගොඩනැඟිය හැකි බව අපට පැහැදිලි ය.

මත්පැන් පානයෙන් වැළකීම උසස් සමාජ රටාවකට අවශ්‍යමය. මත්පැන් නිසා සමාජය දූෂිත වේ. මෙය ලක් දෙරණින් සදහටම තුරන් කළ යුතු විෂකි. පාසල් සිසුන් පවා ඒවාට ඇබ්බැහි වීම නිසා බාල පරපුරම නොමඟ ගොස් පරිහානියට පත්ව ඇත. මෙය සමාජ පිළිලයක් බව සඳහන් කළ හැක. තවද ලද දෙයින් සතුටු වීම, ධර්මිෂ්ඨ සමාජයේ තුළ තිබිය යුතු උතුම්ම සාරධර්මයකි. එහෙත් මෙය අප සමාජය තුළ ඉතා ශීඝ්‍රව බැහැර යමින් තිබෙන දහමකි. පාසල් සිසුන් මෙන්ම ගිහි පැවිදි කවුරු තුළත් ලද දෙයින් සතුටුවීමේ ගුණය තිබිය යුතුමයි. කලකෝලාහල, රට වල් අතර යුදගිනි ඇවිලීම්, ඉඩම් නඩු වැනි දෑ සිදු කරනුයේ ලද දෙයින් සතුටු නොවීම නිසා ය. මෙම භයානක විපත්වලින් අප බාල පරපුර බේරාගැනීම සඳහා ඔවුන්ට කුඩා කල සිටම ලද දෙයින් සතුටු වීමේ පුරුද්ද පුරුදු පුහුණු කළ යුතු ය. වර්තමාන සමාජයේ තරුණ ගිහි පැවිදි කා හටත් ලද දෙයින් සතුටුවීම ධර්මිෂ්ට දිවි පෙවෙතකට මාවතක් බඳු ය.

එසේම කළගුණ සැලකීම ද සදාචාර සම්පන්න ධර්මිෂ්ඨ සමාජයක් ගොඩනංවාලීමට අත්‍යවශ්‍ය ගුණයකි. සමාජයක් ගත් කල, බාල, තරුණ, මහලු බොහෝ දෙනාට කළ උපකාර අමතක වීම, වංචනික ලෙස තම අවශ්‍යතාවයන් සපුරා ගැනීම වැනි දේවල් වැඩි දෙනෙකුට කළ ගුණ සැලකීමේ අගය නොවැටහීමට හේතුවක් බව දහම් පොත්පත්වලින් අප ඉගෙන ගෙන ඇත. කළ උපකාරයට ප්‍රත්‍යඋපකාර කිරීම අප අමාමෑණී තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේ ලොවට පෙන්වා දුන් ක්‍රියාවටම නගා ආදර්ශ සම්පන්නව දේශනා කර වදාළ ශ්‍රී සද්ධර්මයේ පැහැදිලිව අපට පෙන්නම් කර ඇත. මෙය බොදුබැති අප සියලු දෙනාම තථාගතයන් වහන්සේගේ අනුගාමිකයන් වශයෙන් පිළිපැදිය යුතු ම සදාචාර ධර්මයකි.

තවද අප සමාජ පසුබිමට අවශ්‍යම ගුණාංග යකි ඉවසීම. මෙය ලොකු කුඩා, තරුණ, බාල, මහලු, ගිහි පැවිදි දෙපක්ෂය තුළම තිබිය යුතු උසස්ම ගුණධර්මයක් බව සඳහන් කරමි. වර්තමාන සමාජයේ ජාති ආගම් වර්ග භේද කලකෝලාහල මනුෂ්‍ය ඝාතන ආදියට ද ඉවසීම නොමැතිව කටයුතු කිරීම හේතු වී ඇතා බව ඒ දෙස මනා විපරමකින් බැලීමේ දි අපට පැහැදිලි වේ. ඉවසීමෙන් සැනසීම ලැබේ කියා අප පැරණි පඬිවරුන්ගේ ඔවදනක් ඇත. කෙනෙකුගේ වැරදි අඩුපාඩුකම් ඉවත් කරගෙන නිවැරදි මඟ ගමන් කිරීමට නම් වැඩිහිටි ඔවදන් පිළිගත යුතුයි. වර්තමානයේ බොහෝ දෙනා තමන්ට මදි පුංචි අවනම්බු වේ යැයි සිතා වැඩිහිටි උතුමන්ගේ ඔවදන් වුවද පිළිගැනීමට මැලිවෙයි. මෙම ගුණධර්ම වර්තමාන සීමිත තරුණ පිරිසකගේ අම්හිරි දේවල් වන්නට පුළුවනි. නමුත් ඉවසීම යන වචනමාත්‍රය බාල මහලු කොයි කාගෙත් චර්යාවට එකතු කර ගත යුතු යහ ගුණාංගයක් බව මතක තබා ගත යුතුයි.

එසේම මංගල සූත්‍රයේ එන මංගල කරුණු දෙකක් වන ධර්ම ශ්‍රවණය හා ධර්ම සාකච්ඡා

පැවැත්වීම යන කරුණු ද බෞද්ධයන් වශයෙන් අපට ඉතා වැදගත් වීමෙන්ම අප හැමගේම යහ පැවැත්ම උදෙසා උපකාරී වන විශේෂ කරුණු දෙකක් ලෙස සඳහන් කළ හැකියි. වර්තමානයේ සන්නිවේදන මාධ්‍ය මගින් නිතර නිතර ධර්ම සාකච්ඡා ආදිය විසුරුවා හරිනු ලබන අතර විශේෂයෙන්ම පොහෝදිනවල ධර්ම සාකච්ඡා, බෝධිපූජා පිංකම්, ධර්ම දේශනා ආදි නොයෙකුත් ආගමික වැඩ සටහන් විකාශනය කරනු ලබයි. නමුත් ඒවා තම ජීවිතයට එකතු කරගන්නා පිරිස ඉතා අල්ප බව ද ඉතා කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතු කරුණකි. සුචරිතවත් ධර්මිෂ්ඨ සමාජයක් බිහිකරලීම සඳහා අවශ්‍ය වනුයේ ධර්මිෂ්ඨ සමාජයක් බිහිකරලීම සඳහා අවශ්‍ය වනුයේ ධර්මය දැනගැනීම හා සාර්ථකව ධර්මය පිළිපැදීමයි.

එසේම අප රටේ දුෂ්කර ගම්මානවල පවා චාරිකාවේ යෙදෙමින් පවත්වන "ගමින් ගමට දහම් සිසිල" වැනි කාලෝචිත ධර්මදේශනා මාලාවන් තුළින් බෞද්ධ අපගේ ධර්මශ්‍රවණය වැඩි දියුණුවීමට, දූෂ්‍ය වූ සිත් සතන් මෙත් සිසිලෙන් නිවා සැනසීමට ධර්මධර භික්ෂූන් වහන්සේලා ගන්නා වූ වෙහෙසත් එවන් සියලුම භික්ෂු භික්ෂුණීන් වහන්සේලාට අපගේ ප්‍රණාමය පුද කරමු.

බුදුදහම අනුව ජීවිතය සාර්ථකව ගත කරන්නටට සුචරිතවත් වූ ධර්මයෙහි හැසිරෙන යහ සමාජයක් ගොඩනැගීමට මංගල සූත්‍රයෙන් ලැබෙන්නේ මනා පිටිවහලකි. එහෙයින් මංගල සූත්‍රය අද සමාජයට පමණක් නොව මතු අනාගතයට ද බෙහෙවින් ම ඵලදායක බව මනාව සනාථ වේ.

එහෙයින් මංගල සූත්‍රයෙන් විද්‍යමාන වන මංගල කරුණු අපේ ජීවිතයට ළඟා කරගෙන උදාවන සම්බුද්ධත්ව ජයන්තියට අපි පිළිවෙතින් පෙළගැසෙමු.


**හේමමාලි ලියනගේ**
වීදියගොඩ.



## බෞද්ධාලෝකය බෞද්ධ සඟරාව දායකත්වයන් ලබාගැනීම

- දෙමසකට වරක් පළවේ
- තැපැල් ගාස්තු ද සමග අවුරුද්දකට දායක මුදල රු. 750 ක් පමණයි.
- ධර්මදානයක් සේ බෙදා හැරීමටත්, පිංකම්වලදී පූජා කිරීමටත් මෙම සඟරාව ලබාගන්න.
- අවම ඇණවුම් ප්‍රමාණය සඟරා 100 කි. 100ට ම මුදල රු. 7500 කි.
- මසකට කලින් ඇණවුම් කරන්නෙ නම් පින් ප්‍රාර්ථනා කිරීමට නම ලිපිනය මුද්‍රණය කරවාගත හැකිය.
- වෙළඳ පණිවිඩ දහම් පණිවිඩ ලබා දීමෙන් ද පින් කටයුත්තක් ලෙසින් අනුග්‍රාහකත්වයන් ලබාදිය හැකිය.

**සියලු විමසීම්: 070 4422688 / 077 7253463**

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
ජාතික ප්‍රචාරක මණ්ඩලය,
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.



# සුගලා දේවියගේ උඩුන්දොර රජදහන

## (මොණරාගල ගලබැද්ද ප්‍රදේශය)

වෙල්ලස්ස යන නාමයෙන් පිදුම් ලද මොනරාගල දිස්ත්‍රික්කයේ අතීත ශ්‍රී විභූතිය විදහාපාන්නේ සශ්‍රීක වෙල් ලක්ෂයක් හා වාරි ශිෂ්ටාචාරයක් තුළිනි. මොනරාගල දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වන සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ නටබුන් වී ගිය වාරිමාර්ග හා වෙනත් ඓතිහාසික සාධක අනුව බලන විට පැහැදිලි වනුයේ දුටුගැමුණු අවධියටත් පෙර සිට ජනාවාස වූ බවකි. දොඹගහවෙල පිහිටි ඓතිහාසික වැලච්ල්ලූගොඩ සෙල්ලිපියට අනුව දුටුගැමුණු රජුගේ දසමහා යෝධයින්ගෙන් අයෙක් වන "පුස්සදේව" සෙන්පතියා ජන්ම ලාභය ලබා ඇත්තේ ද මෙම ප්‍රදේශයේ ය. මහා පරාක්‍රමබාහු රජ දවස සිරිවල්ලභ රජුගේ බිසව වන සුගලා දේවිය මෙම ප්‍රදේශය "සියඹලාණ්ඩුව" ලෙස පාලනය කළ බවට වර්තමාන ගලබැද්ද ප්‍රදේශයේ පිහිටි පැරණි බිසෝකොටුව පොකුණ සාක්ෂි දරයි. සුගලා දේවිය ස්නානය සඳහා යොදාගත් මෙම පොකුණ අදත් සුරක්ෂිතව පවතී. ජනප්‍රවාදයේ එන ආකාරයට වර්තමානයේ ඇතිමලේ නමින් හඳුන්වන ප්‍රදේශය තුළ දුටුගැමුණු එළාර යුද්ධයට පෙර සද්ධාතිස්ස කුමරුන් විසින් වැව් අමුණු සකස් කොට වෙල් ලක්ෂයක් කරවූ බව ඉතිහාසයේ සදහන් වේ.

මාණාභරණ නමින් ප්‍රාදේශීය පාලකයෙක් මෙම ප්‍රදේශයේ සිටි බවට සාධක මුතුකණ්ඩිය ප්‍රදේශයෙන් හමුවේ. මෙම ප්‍රදේශයේ පිහිටි පැරණි රජමහා විහාර ලෙස බුද්දම රජමහාවිහාරය, වත්තේගම රජමහා විහාරය, මාණාභරණ රජමහා විහාරය, වට්ටාරම පුරාණ විහාරය, ආදි වෙහෙර විහාර පෙන්වාදිය හැකිය. පැරණි බුදුපිළිම නටබුන් වූ දාගැබ් මෙන්ම මේවායේ පිහිටුවා ඇති සෙල්ලිපිවල කරුණු පිළිබඳව ද මෙතෙක් කිසිවකුගේ අවධානය යොමු වී නොමැත. ඓතිහාසික වටිනාකමක් ඇති ගොවිඳුපුර කන්ද පිළිබඳව අවධානය යොමු නොවීම ද ප්‍රදේශයේ ඉතිහාසයට මහත් අඩුවකි. ගොවිඳුපුර ප්‍රදේශයේ පිහිටි ගොවිඳුපුර ආරණ්‍ය සේනාසයේ ගල්කණු

සිරිපතුලක ආකෘතියත් ඌර්ණරෝම ධාතුවට සමාන වූ ගලත්, ගල්ලෙන් සෙල්ලිපි, පියගැටපෙළ, යනාදිය දක්නට ලැබෙයි. ගොව්දුහෙළ නමින් උස් පර්වත භූමිය බ්‍රිතාන්‍ය පාලන සමයේ "වෙස්ට් මිනිස්ටර් ඇබේ" නමින් හඳුන්වා දී ඇත. බුවනෙකබා රජ සමයට අයත් බුවනෙකබා රජමහා විහාරය ද මෙහි පිහිටා ඇත. කලුගොල්ලයාය ප්‍රදේශයේ උස අඩි 57ක නාමලුව නැමැති පුරාණ රජමහා විහාරස්ථානයක් ද දැකිය හැකිය. එහි පැරණි ගල්කණු වූ ගරා වැටුණු සුවිශාල ස්ථූපයක් හා ඒ වටා සලපතල මන්දාවක සළකුණු ද සහිත සෙල්ලිපියක් හා පොකුණක් ද දැකිය හැකිය. පර්වතයේ ද ගලින් නෙලන ලද කුටියක් තුළ ශෛලමය කොට්ටයක් සහිත ඇඳක් ද ඇත. සුගලා දේවිය විසින් දන්ත ධාතූන් වහන්සේ රැගෙනවිත් මෙහි සිටි බවට ද සාක්ෂි පවති.



කිඹුලාවෙල පුරාණ රජමහා විහාරය ද කාවන්තිස්ස රජ දවස කරවන ලද්දකි. දර්ශනීය බිසෝකොටුවක් ද මෙම ප්‍රදේශයේ දැකිය හැකිය.

ඓතිහාසික සාධක අතින් වඩාත් වැදගත්කමක් හිමිවන ඌව වෙල්ලස්ස තුළ සැඟවුණු ස්ථාන රැසක් දක්නට ඇත. තවමත් කිසිවෙකු නොදන්නා එවැනි ඓතිහාසික ස්ථාන රැසක් ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ දැක ගත හැකිය. සුගලාදේවිය පාත්‍රා ධාතුව හා දන්ත ධාතූන් වහන්සේලා ගෙන සැඟවී සිටි ගලබැද්ද ප්‍රදේශය ද එවන් ස්ථානයකි. මොණරාගල නගරයේ සිට සියඹලාණ්ඩුව පාරේ (අම්පාර මාර්ගයේ) කි.මී. 8ක් පමණ දුරින් ගලබැද්ද ප්‍රදේශය පිහිටා තිබේ. මේ ගම්මානයට පිටුපසින් ද ඇදී යන්නේ මරගල කඳුවැටිය යි. පුරාණයේ මෙම පෙදෙස අයත්ව තිබී ඇත්තේ අට්ඨසහස්ස රටටයි. එහි අගනුවර වූ උදුන්දොර අද ගලබැද්දයි. එදා උදුන්දොර රාජධානිය (12 වන සියවස) පාලනය කළේ එඩිතර කාන්තාවක් ලෙස ඉතිහාසයේ සඳහන් වන සුගලා රැජනයි. උදුන්දොර අමරගිරි පර්වතය සමීපයෙහි සුරක්ෂිතව වැඩ සිටි දළදා පාත්‍රාධාතූන් ගැන දළදා පූජාවලිය තුළ ද සඳහන් වේ.

මෙහි පුරාණ නටබුන් වශයෙන් පවතින අලංකාර පොකුණ එදා පැවති ශ්‍රී විභූතියට උදාහරණ සපයයි. ගම්වැසියන් එය හඳුන්වන්නේ බිසෝකොටුව නමිනි. පොළොවෙහි සිට අඩි 5ක් පමණ උසට සකසන ලද වේදිකාවක් මැදිකර මෙම පොකුණ ඉදිකර තිබේ. එය දිගින් හා පළලින් අඩි 60ක් පමණ වේ. සිව් පසින් පිහිටි සිංහ මුඛ හතරකින් පොකුණට ජලය වෑස්සේ. පොකුණ කැටයම් කළ ගල්පුවරුවලින් සරසා තිබේ. පොකුණට ජලය ලබාගෙන ඇත්තේ කන්දේ සිට එන ජල මාර්ගයක් හරස් කිරීමෙනි. අදත් මෙය අසලින් දොළ පාරක් ගලා බසියි. අලංකාර වැසිකිළි ගලක් ද මේ අසල දකින්නට ලැබේ. වැසිකිලිය විශේෂිතම නිර්මාණයක් වන අතර මෙවැන්නක් වෙන ස්ථානයක දකින්න ලැබී නොමැති බව විද්වත් මතය යි. පොකුණ පසෙකින් දකින්නට ලැබෙන මෙම වැසිකිළිය ගලෙන් කරන ලද නිර්මාණයකි. පොකුණ වටා ගල් කණු සකස් කර තිබූ බවටත් සාක්ෂි දකින්නට ඇත. මෙම ප්‍රදේශයේ තිබෙන අනෙක් නිර්මාණ කලාවන්ට වඩා වෙනස් ක්‍රමයක් අනුගමනය කරන නිසා මෙය හුදකලා විශිෂ්ට ස්ථානයක් බවට පත් වී ඇත. ජනප්‍රවාද පවසන්නේ මෙම පොකුණේ සුගලා රැජිණ ස්නානය කළ බවයි.

පොකුණට නුදුරින් පිහිටි පැරණි ලෙන් විහාරය එකල රාජධානියේ වැඳුම් පිදුම් කළ ස්ථානය වශයෙන් සැලකේ. එහි පැරණි ගල්කණු, කැටයම් පුවරු



සුගලා දේවිය ස්නානය කළා යැයි සැලකෙන පොකුණ

ආදිය දක්නට ලැබේ. වර්තමානයේ මොණරාගල පාමුල ගලබැද්ද ලෙස හඳුන්වන නටබුන් වූ මාලිගයක් සහ පොකුණක් සහිත ප්‍රදේශයක් ඇත. තවමත් කැනීම්කර සංරක්ෂණය කර නොමැති මෙහි මාලිගයේ සැලැස්ම පොළොන්නරුව සහ පඬුවස්නුවර ඇති පොළොන්නරු යුගයේ රජ මාළිගාවල සැලැස්මට සමාන වන මුත් ප්‍රමාණයෙන් ඒවාට වඩා කුඩාය. මාළිගයේ නටබුන්වලට නුදුරින් ඇති 'කෙල්ලන්ගේ වල' නමින් හැඳින්වෙන සංරක්ෂණය කර ඇති පොකුණ පොළොන්නරු යුගයේ ගෘහනිර්මාණ ලක්ෂණවලින් යුක්ත වේ. මෙම ප්‍රදේශය පෙර කල හඳුන්වා ඇත්තේ අට දහස් රට ලෙසිනි. අටදහස් රට ඉතා සුවිශේෂී



සුගලා දේවිය භාවිතා කළා යැයි සැලකෙන වැසිකිලිය

ආරක්ෂිත ප්‍රදේශයකි. බටහිරින් කිරිඳිඔයත් දකුණෙන් මුහුදු තීරයත්, උතුරින් මහවැලි නදියත් අට දහස් රටේ සුවිශේෂිත වේ. වර්තමාන වෙල්ලස්ස ලෙස හැඳින්වෙන මෙම ප්‍රදේශයේ එදා අගනුවර වුයේ උදුන් දොරයි. ගලබැද්ද නමින් හඳුන්වන්නේ ඉතා විශේෂ දේශගුණික සාධකවලින් යුතු සෞම්‍ය ප්‍රදේශයකි. රජවරුන්හට සුව දායක පරිසරයක් වූ මෙහි තිබිය යුතු ආරක්ෂිත භෞතික ලක්ෂණ ද පවති. එහි සතර දිශාවෙන් තෙදිසාවක් ම කඳු වැටිවලින් සීමා වී ඇත. එම ආරක්ෂාකාරී තත්වය නිසාම ශ්‍රී වල්ලභ කුමරු උඳුන්දොර සිය රාජධානිය කරගන්නට සිතුවා විය හැකිය. යම් හෙයකින් තමන්ට විරුද්ධව සතුරු සේනාවෝ පැමිණියත් කඳු මුදුන්වල නිරීක්ෂණ ස්ථාන පිහිටුවීමෙන් කල් ඇතිව එම සේනා ආගමනය දැන ගැනීමටත් ඔවුන්ට විරුද්ධව ප්‍රහාරක බල ඇණි පිටත් කර වීමටත් හැකියාව ලැබේ. කෙසේ වුවද අට දහස් රටේ අගනගරය ලෙස උදුන් දොර පෙන්වාදීම සඳහා අවශ්‍ය තරම් සාධක හා නටබුන් ද එහි පවති. උදුන් දොර රාජධානියේ දීප්තිමත් යුගයක් වුයේ ශ්‍රී වල්ලභ ගේ බිසව වූ සුගලා දේවියගේ රාජ්‍ය පාලන යුගය යි. වර්තමාන ගලබැද්ද බිසෝ කොටුව සුගලා බිසව වෙනුවෙන් ඉදි වූ ඒවා බවට සාක්ෂි ඇත. සුගලා දේවිය පැරකුම්බා රජ යුද වැද ජය ගන්නා තුරුම උදුන්දොර සිට අටදහස්රට පාලනය කර ඇත. නමුදු පසුකාලීනව පරාක්‍රමබාහු රජු සුගලා දේවිය පරදවා දළදා වහන්සේ අත්පත් කර ගත් පසු මෙම රජදහන සැඟවී ගියේය.

ශ්‍රී ලංකාව තුළ ඓතිහාසිකමය වශයෙන් වැදගත්කමක් උසුලන ස්ථාන බහුල වශයෙන් දක්නට ලැබේ. සුගලාදේවිය වාසය කළා යැයි පැවසෙන මෙම උඳුන්දොර රජදහන නැමැති ස්ථානය තවත් එක් උරුමයක් ලෙස හඳුනාගත හැකිය. මෙවැනි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සංරක්ෂණය කර ගනිමින් ඉදිරි පරපුර සඳහා රැක ගැනීම අපගේ යුතුකමක් හා වගකීමක් සේ සැලකිය හැකිය.

**ආර්.ඩී.සී.රාමනායක**

සමාජ විද්‍යා ගෞරව උපාධි අපේක්ෂිකා

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



# දැනගෙන යමු සිරිපාදේ

- බුදුරජාණන් වහන්සේගේ තුන්වන ලංකා ගමනේ දී එනම්, බුද්ධත්වයෙන් 8 වැනි වර්ෂයේ දී වෙසක් පුන් පොහොය දිනෙක, ශ්‍රී සුමන සමන් දෙවියන්ගේ ආරාධනයෙන් සමනල ගිරි පර්වතයට වැඩම කොට එහි ඉන්ද්‍ර නීල මාණික්‍යයක් මත මුනි සිරිපා සලකුණ පිහිට වූ සේක.
- බුදුරජාණන් වහන්සේ 500 ක් මහරහතන් වහන්සේලා සමඟින් ශ්‍රී පාදස්ථානයට වැඩම කොට, වම් සිරිපා සටහන තැබීමෙන් පසු දිවාගුහාවේ සමවත් සුවයෙන් වැඩසිටි සේක. (බුදුරජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පිරිසිදු වූ ස්ථාන 16 හෙවත් සොළොස්මස්ථාන අතරින් 4 වැනි සහ 5 වැනි ස්ථානය)
- දිවාගුහාව හෙවත් භගවාලෙන පිහිටා ඇත්තේ ශ්‍රීපාද මළුවේ සිට හරියටම අඩි 300 ක් පහළිනි. හැටන් පාරේ 'දන්සැල' ඉදිරිපස භගවාලෙන පිහිටා ඇත. 'භගවා' කියන්නේ බුදුරජාණන් වහන්සේටය. භගවාලෙනෙහි නිශ්ශංකමල්ල රජතුමන්ගේ බිතු සිතුවමක් සහ ශිලා ලිපි දෙකක් දැකගත හැකිය.
- ශ්‍රී පාදස්ථානය මළු තුනකින් සමන්විත වන අතර, ඉහළම උඩ මළුවේ පිහිටි ශ්‍රීපාද ලාංඡනයේ දිග අඩි 5 අඟල් 5 ක් ද, පළල අඩි 2 අඟල් 7 ක් ද වේ.
- ශ්‍රීපාද ලාංඡනය ස්වස්තිකය, පුන්කලස, ඡත්‍රය, සේසත, ශංඛය, චාමරය ඇතුළු මංගල ලක්ෂණ (මඟුල් ලකුණු) 108 කින් සමන්විතය. බුදුරජාණන් වහන්සේගේ සිරිපතුල් දෙකෙහිම මඟුල් ලකුණු 216 කි.
- ශ්‍රීපාද දෙවන මළුවේ පිහිටි සමන් දේවාලයේ තැන්පත් කර ඇත්තේ සුදු හඳුන් දැවමුවා සමන් දේව ප්‍රතිමාවකි. පූජාවලියේ සහ චූලවංශයේ සඳහන් පරිදි මෙම සුමන සමන් දේව ප්‍රතිමාව පූජාකර ඇත්තේ දඹදෙනි රාජධානි සමයේ රජ කළ දෙවන පරාක්‍රමබාහු රජතුමන්ගේ (1236 - 1270) ප්‍රධාන ඇමති තනතුර හෙබවූ දේවප්‍රතිරාජ ඇමති විසිනි. අඩි එකහමාරක් පමණ උස මෙම ප්‍රතිමාව දැනට ලංකාවේ ඇති පැරණිම දේව ප්‍රතිමාව ලෙස සැලකේ.
- ශ්‍රීපාද පද්මයට පූජා කිරීමට හොඳම මල් වර්ගය පුවක් මල්ය. සමන් දෙවියන්ට පූජා කිරීමට සුදුසුම මල් වර්ගය සුදු නෙළුම් මල්ය.



**සමන් දෙව්රජු සමනොලට වැඩමවන සේ බුදුරජාණන් වහන්සේට ආරාධනා කිරීම**



**දෙව් බඹුන්ගේ පුද සත්කාර විඳිමින් අහසින් සමනොලට වැඩම වීම**




**සමනොල මුදුනේ ශ්‍රීපාද ලාංඡනය පිහිටු වීම**

- ශ්‍රීපාද පද්මය දෝවනය කිරීම සඳහා අවශ්‍ය පැන් රැගෙන එනු ලබන්නේ 'භගවාලෙන' (දිවාගුහාව) අසල ඇති පොකුණෙනි. ශ්‍රීපාද පද්මය දෝවනය කරනු ලබන පැන් හඳුන්වන්නේ 'අමා පැන්' ලෙසිනි. මෙම පැන් විවිධ රෝගාබාධ සඳහා දිවඔසුවක් ලෙස බැතිමත්තු විශ්වාස කරති.
- ශ්‍රීපාද මළුවේ දිනපතාම බුද්ධ පූජාව පැවැත්වේ. 'ඉර සේවය' අවසාන වනවාත් සමඟ උදෑසන බුද්ධ පූජාවත්, පෙ.ව. 11.00 ට දහවල් බුද්ධ පූජාවත්, හවස ගිලන්පස පූජාවත් දිනපතා පැවැත්වේ. බදාදා සහ සෙනසුරාදා කෙම්මුර දිනවල දී සිරිපතුල දෝවනය කිරීම සිදුවේ. ඒ සඳහා සඳුන්, කහ, දෙහි, පොල් කිරි ආදිය පැන් සමඟ මිශ්‍ර කිරීමෙන් සාදාගන්නා 'සඳුන් කිරි පැන්' නමැති විශේෂ නානු මිශ්‍රණයකින් පද්මය දෝවනය කිරීම සිදුකරනු ලබයි. බදාදා සහ සෙනසුරාදා කෙම්මුර දිනවල දී පමණක් සිදුකරන මෙම චාරිත්‍රය දැකබලා ගැනීමට වන්දනාකරුවන්ට අවස්ථාව ලැබෙන්නේ නැත.
- ශ්‍රීපාදස්ථානය අධිගෘහිත වූ ශ්‍රී සුමන සමන් දෙව්රජාණෝ බුදුන් වහන්සේගෙන් දහම් අසා සෝවාන්ඵලයට පත්වූහ. එබැවින් ශ්‍රීලාංකේය ප්‍රථම මාර්ගඵලලාභියා ද, ප්‍රථම බෞද්ධ ශ්‍රාවකයා ද, ප්‍රථම බෞද්ධ උපාසකයා ද වන්නේ සුමන සමන් දෙවියන්ය. නාග ගෝත්‍රික දෙවියකු වන සුමන සමන් දෙවියන්ගේ බැල්ම හා ආකර්ෂණය බලපැවැත්වෙන්නේ දිවා රෑ දෙකෙහිම 1.00 සිට 1.24 දක්වා කාලයයි.
- රාජාවලිය ග්‍රන්ථයේ සඳහන් වන පරිදි සිරිපා මළුවේ මුලින්ම ඡත්‍රයක් සහිත මණ්ඩපයක් සාදා ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් විසිනි. සිරිපා මළුවේ සමන් දේවාලයක් ඉදිකරවා ඇත්තේ දෙවැනි පරාක්‍රමබාහු රජතුමන් විසිනි.
- මහානාම භික්ෂූන් වහන්සේ විසින් 5 වැනි සියවසේ දී සම්පාදිතැයි සැලකෙන මහාවංශයේ සඳහන් වන පරිදි කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු, පළමුවන විජයබාහු රජු, පළමුවන පරාක්‍රමබාහු රජු, වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, බුවනෙකබාහු රජු, පළමු විමලධර්මසූරිය රජු වැනි රජවරු ශ්‍රීපාදය වැඳපුදා ගෙන ඇත.
- ලෝකයේ ආගමික ශාස්තෘවරුන් සම්බන්ධ ආගමික සිද්ධස්ථාන අතරින් මුහුදු මට්ටමින්




ශ්‍රීපාද මළුව සහ ශ්‍රීපාද පද්මය




ශ්‍රී සුමන සමන් දේවාලය සහ සුදුහඳුන් සමන් දේව ප්‍රතිමාව

ඉහළින්ම පිහිටා ඇති සිද්ධස්ථානය වශයෙන් සැලකෙන්නේ ශ්‍රීපාදස්ථානයයි. මුහුදු මට්ටමේ සිට උස අඩි 7,360 ක් හෙවත් මීටර් 2,243 ක් ඉහළින් පිහිටා ඇත.

- ලෝකයේ දීර්ඝතම වන්දනා සමය සේ සැලකෙන්නේ ශ්‍රීපාද වන්දනා වාරයයි. දෙසැම්බර් (උඳුවප්) පොහොයෙන් ඇරඹෙන සිරිපා වන්දනා සමය මැයි (වෙසක්) පොහොය දක්වා දිවා රෑ දෙකෙහිම නොකඩවා එකදිගට මාස 5 ක් පැවැත්වේ.
- ශ්‍රී පාදස්ථානය වැඳපුදා ගැනීමට ප්‍රධාන පාරවල් 3 කි. හැටන් පාර, රත්නපුර පාර (රජ මාවත) සහ කුරුවිට පාර එම ප්‍රධාන පාරවල් 3 යි. හැටන් පාර නල්ලතන්නියෙන් ඇරඹෙන අතර, මළුව දක්වා දුර කි.මී. 4 යි මීටර් 900 කි. රත්නපුර පාර පළාබද්දල, සිරිපාගමින් ඇරඹෙන අතර, දුර කි.මී. 8 යි මීටර් 500 කි. කුරුවිට පාර එරත්නෙන් ඇරඹෙන අතර දුර කි.මී. 12 ක් පමණ වේ.
- හැටන් පාර, නල්ලතන්නියේ සිට සිරිපා මළුව දක්වා පඩි 13,944 කි. රත්නපුර පාර සහ කුරුවිට පාර වැටී ඇත්තේ ශ්‍රීපාද රක්ෂිතය මැදිනි. ශ්‍රීපාද වන රක්ෂිතය අක්කර 56,000 කි. වර්ග සැතපුම්වලින් ගතහොත් 8,641 කි. හෙක්ටයාර්වලින් 22,379 කි. ශ්‍රීපාද රක්ෂිතය අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේ 1940 ඔක්තෝබර් 25 වැනිදාය.
- ශ්‍රී ලංකාවේ ප්‍රධානම ගංගාවන් වන මහවැලි, කැලණි, වලවේ, කළු යන ගංගා හතර ආරම්භ වන්නේ සමනල අඩවියෙනි. ශ්‍රීපාදස්ථානය




මංගල ලක්ෂණ 108 කින් සමන්විත ශ්‍රීපාද ලාංඡනය

සිව් කොණේ ඇති සමන් දේවාල 4 පිහිටා ඇත්තේ ද මෙම ගංගා හතර ආශ්‍රිතවය. මහියංගන සමන් දේවාලය මහවැලි ගඟ අසලත්, දැරණියගල සමන් දේවාලය කැලණි ගඟ අසලත්, බොල්තුඹේ සමන් දේවාලය වලවේ ගඟ අසලත්, රත්නපුර මහ සමන් දේවාලය කළු ගඟ අසලත් පිහිටා ඇත. තවද, මෙම දේවාල 4 පිහිටා ඇත්තේ මළුවේ සිට උතුරු, දකුණු, නැඟෙනහිර, බස්නාහිර දිශානුගතවය. බටහිරින් රත්නපුර මහා සමන් දේවාලය ද, නැඟෙනහිරින් මහියංගන සමන් දේවාලය ද, දකුණෙන් බළංගොඩ, බොල්තුඹේ සමන් දේවාලය ද, උතුරින් දැරණියගල සමන් දේවාලය ද පිහිටා තිබීම විශේෂයකි.

- ශ්‍රීපාදස්ථානය අයත්වන්නේ සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලයේ උතුරු උඩපත්තුවටය.
- ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා සමන් දෙවියන්ට වූ භාරයකට අනුව ශ්‍රීපාදස්ථානයට විදුලිබලය ලැබුණේ 1950 මාර්තු මස 04 වැනි මැදින් පුරපසළොස්වක පොහොය දින දීය.
- සමන් සුරිඳුන්ට භාරවී, තෙරුවන් ගුණ වර්ණනා කෙරෙන 'තුන් සරණය' කවි 130 කින් සමන්විත වන්දනා කවි පොතකි. මහනුවර අවධියේ දෙවන රාජසිංහ රජ සමයේ (ක්‍රි.ව. 1634 - 1684) රචිත මෙම කවි පන්තියේ කතුවරයාගේ නම ප්‍රසිද්ධ කර නැති අතර, තාඹුගල ගමේ උපන් අයෙකි. 'හිමගත වර්ණනාව' කවි 117 කින් සමන්විතය. 'සමනල හෑල්ල' කවි 183 කි.
- සමනල කඳු ශිඛරය ලෝකයේ විශාලම ස්වාභාවික පිරමීඩයයි. මේ වටා ඇති පරිවාර කඳු ලෙස බෑන සමනොළ, ධර්මරාජගල, කුණුදිය පර්වතය, ගවරවිල, ලිහිණිහෙළ, ඉදිකටුපාන කඳු පිහිටා ඇත.
- ගෙත්තම්පාණේදී කෝඩුකාරයා නූල් ගෙත්තම් කිරීම, ඉහළට නඟින්නන්ට සහ පහළට බසින්නන්ට ආශීර්වාද කිරීම, නඩේ ගුරා සහ සෙසු බැතිමතුන් තුන්සරණය, හිමගත වර්ණනාව වැනි බුදුගුණ කවි හඬනඟා කීම, ඉරසේවය නැරඹීම, තමන් වැඳපුදා ගැනීමට ගිය වාර ගණන අනුව ඝණ්ඨාරය නාද කිරීම වැනි චාරිත්‍ර දැකිය හැක්කේ ශ්‍රීපාද වන්දනාවේදී පමණි.

**ශ්‍රී පාදස්ථානය වැඳීම**

**කල්‍යාණතෝ ගගනතෝ මුනියත්ථ ගන්ත්වා**
**දස්සේසි චක්කවර ලක්ඛණ පාදලංඡං**
**ලංකා මහීවර වධූ මකුටෝපමාණං**
**වන්දාමහං සුමන කූට සිලුච්චයං තං**



**දිවාගුහාව නොහොත් භගවා ලෙන වැඳීම**

ඛීණාසවේහි සහ පඤ්චසතේහි ගන්ත්වා
යස්මිං අකාසි භගවා ස දිවා විහාරං
සම්වුල්ල සාල සුමනාචල පාද දේසේ
වන්දේ සුසීතල මහං භගවා ගුහං තං

**ශ්‍රී සුමන සමන් දෙවියන් වැඳීම**

ශ්‍රී මුනින්ද්‍ර පාද පද්ම සංරක්ෂණ ධාරං
ශ්‍රී සමන්ත කූටවාස ශාසනෝපකාරං
ශ්‍රී සමන්ත දේවරාජ ස්වර්ණවාස හස්තං
ශ්‍රී විරාජමාන පුෂ්පආසන ප්‍රවිෂ්ටං

**ශ්‍රී සුමන සමන් දෙවියන්ට පින් දීම**

ශුභ්‍රවර්ණාති දේවේන - දිව්‍යාභරණ භූෂිතම්
කුඤ්ජර වාහනඤ්ඤෙච්ච - සුමනදේවෝ නමෝ වරම්
සම්බුද්ධ පාදවරලඤ්ජන සෝභිතම්හි
වාසෝ සමන්ත ගිරි මුද්ධනි දේවරාජා
පුඤ්ඤානුමෝදිය ඉදං සුමනාභිධානෝ
පාලේතු මං සතත සාත හිතාවහන්තෝ

**ශ්‍රී සුමන සමන් දේව ශාන්තිය**

ගන්ධ පුෂ්ප වුල්ලිතං විශාල ශාල මල්ලිකා
චම්පකා අශෝක නාග පූග වෘක්ෂ රඤ්ජිතා
නීල පීත ශ්වේත වර්ණ පක්ෂි රාශි සංගතා
ශ්‍රී සමන්ත කූඨවාස දේව දානතේ සුඛං

ශීත ලාම්බු පූර්ණකං තඩාග නික්ධරඃ
වාත මේඝ ධරණිපාත රම්‍ය භූමි වාලුකා
ශ්‍රී සමන්ත කූට සෞම්‍ය නිත්‍ය වාස සම්භවං
ශ්‍රී සමන්ත දේවරාජ සෞඛ්‍ය දානතේ සුඛං

ශ්‍රී සමන්ත භද්‍ර ලෝක නාථ පාද ලාඤ්ජනං
සුප්‍ර තිෂ්ඨි තාරධීක පුණ්‍ය ශුද්ධ චින්තනඃ
ශ්‍රෝත පත්ති මාර්ග ප්‍රාප්ත බුද්ධ රාජ වන්දනං
ශාන්ති දාන කෘතවතේ සමන්ත දේව රාජනං

දක්ෂ පක්ෂ යක්ෂ රාක්ෂ දර්පණෂ්ට නිර්භයං
රාග ද්වේශ මෝහ නාස නත්ථි සුමන දේවතා
තීක්ෂණස්‍ය ප්‍රඥා සාග රස්‍ය වීර කායිකං
කාය මාන සඤ්ඤද රෝග පීඩ භෂ්මතා චිරඃ

ලෝක නාථ සාසනාය සුප්‍රතිෂ්ඨිතං ගතං
ලංක දේශ ක්ෂීර පල්ලවේන බුද්ධ පූජනං
ශ්‍රී ඝනාය භක්ති ප්‍රේම ප්‍රාප්ත ද්වය රාජනං
ශාන්ති සෞඛ්‍ය රක්ෂිතුං ප්‍රධාන තීති ආතුරං

බුද්ධ ධර්ම සංඝ රත්න පූජනාය කර්මනා
චිත්ත ප්‍රීති සාගරස්‍ය ප්‍රාප්ත සුමන දේවතා
ලංකාදීප පූර්ව දේශ රක්ෂිතාය නිර්මලං
පාද පද්ම ශ්‍රී නමස්තු ශ්‍රී සමන්ත දේවතා


**නිශාන්ත ගුණසේකර**
165, දේවානම්පියතිස්ස මාවත
කොළඹ 10.



# රාජ්‍ය පාලනයට අවැසි දස සක්විතිවත්

බෞද්ධ ඉගැන්වීම්වලට අනුව පරමාදර්ශී රාජ්‍යය පාලනයක් පිළිබඳව කරුණු අන්තර්ගත වන්නේ බෞද්ධ චක්කවත්ති සංකල්පය තුළ ය. චක්කවත්ති සංකල්පය භාරතීය සමාජයෙහි ක්‍රියාත්මක වූ ප්‍රබල දේශපාලන සංකල්පයකි. චක්කවත්ති සංකල්පය බ්‍රාහ්මණ සමාජය තුළ ද පිළිගෙන ඇත. ඒ චක්කවත්ති සංකල්පය පිළිබඳ බ්‍රාහ්මණ මතයට වඩා බෞද්ධ මතය සපුරා වෙනස් ය. නිරායුධව චින්තන විප්ලවයක් හා ධර්ම විජය තුළින් ජනතාව අවනත කරවන අපරාධ දූෂණ පිළිකුල් කරන ආර්ථික හා ආධ්‍යාත්මික සමෘද්ධිය ඇති කරන රාජ්‍ය ප්‍රතිපත්තියකි බෞද්ධ චක්කවත්ති සංකල්පය.

සාධාරණ. යුක්ති සහගත බෞද්ධ ඉගැන්වීමක් වන චක්කවත්ති සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලින් සමන්විත ය. සංග්‍රාම හා ඒකාධිපති ලක්ෂණ මෙහි දැකගත නො හැකිය. එමෙන්ම අයුධ සන්නද්ධ වීමක්, ප්‍රාණඝාත වධ බන්ධන හා දණ්ඩන විධි උගන්වා නැත. ධර්මයට අනුව කටයුතු කරනු ලබන පාලකයා අයුතු ලෙස බලය අල්ලාගැනීමට උත්සාහ දරන්නේ නැත. දළ්හනේමි සක්විති රජු තම පුතුට රාජ්‍ය භාර දුන් පසු සුළු කාලයකින් චක්‍රරත්නය අතුරුදහන්විය. මේ පිළිබඳ ව නැවත විමසීමට පිය රජු වෙත ගිය මොහොතේ චක්‍රරත්නය යනු පිය උරුමයෙන් ලද්දක් නො වනබව පැහැදිලි කෙළේය. චක්‍රරත්නය රැකගැනීම යනු රාජ්‍ය බලය රැකගැනීමයි. එය පාලකයාගේ ප්‍රතිපත්ති මත සිදුවන දෙයක් මිස බලෙන් ලබාගත නො හැකිය. රජු අයුක්ති සහගත වන්නේ ද එවිට චක්‍රරත්නය අතුරුදන් වේ. ධර්මානුකූල ව යුක්ති සහගත ව කටයුතු කරන්නේ ද එවිට චක්‍රරත්නය පහළ වේ. යනුවෙන් චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි විස්තර වේ.

**"නහි තෙ තාත දිබ්බං චක්කරතනං පෙත්තිකං දායජ්ජං ඉංඝත්වං තාත අරියෙ චක්කවත්ති වත්තේ වත්තාහි, ඉදං කො තාත අරියං චක්කවත්තිං වත්තීති දිබ්බං චක්කරතනං පාතුභවන්ති,"**

දී.නි., සසසල චක්කවත්ති සීහනාද සූත්‍රය, 102 පිටුව.






පාලකයා ජනතාව විසින් තෝරා ගත්තත් නැතත් පිය උරුමයෙන් ලැබුණ ද ඔහුගේ පාලනය ජනතාව සතුටු කිරීමට හා ධර්මය ආරක්ෂා කිරීමට හැකි පාලනයක් විය යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් වශයෙන් හඳුන්වනු ලබන්නේ එයයි. රජ කෙනෙක් සතු රත්න හතක් ගැන මහා සුදස්සන සූත්‍රයේ සඳහන් වේ. බෞද්ධ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ මෙම සප්ත වස්තූන්ගෙන් පරිපූර්ණ වූ විට ය. පළමු රත්නය වන්නේ චක්‍රරත්නයයි. මේ තුළින් රජුගේ පරමාධිපත්‍යය බලය හැඟවෙයි. රජුට පවරාදුන් බලය රටවැසියාගේ යහපත වෙනුවෙන් යොදවනු ලබයි. එමෙන් ම මේ තුළින් අහිංසාව හා යුක්තිය අවශේෂ වශයෙන් සංකේතවත් කරයි. ඔහු ධර්මය නො ඉක්මවා රජකම් කරයි.

එමෙන්ම භික්ෂුව ද පාලකයාට අවනත වියයුතු බවට විනය පිටකයේ දී බුදුන්වහන්සේ විසින් ප්‍රඥප්තියක් පනවා ඇත. භික්ෂුව මෙලෙසින් අවනත විය යුත්තේ කිනම් පාලකයාට ද යන්න බුද්ධඝෝෂ තෙරුන් විසින් සමන්තපාසාදිකාවේදී අර්ථකථනය කර ඇත. එනම් රජුගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලදී පාලනයට අවනත විය යුතුය. අධර්මිෂ්ඨ ක්‍රියාවලදී අවනත නො විය යුතුය.

**"අඤ්ඤස්මිං ධම්මිකෙ කම්මෙ අනුවත්තිතම්බං අධම්මිකෙ පන න කස්සචි අනුවත්ති තබ්බං"**

වි.පි. අ, සමන්ත පාසාදිකාව 270 පිටුව.

ධාර්මික හෙවත් දැහැමි පාලනය යනු සාධාරණ ව පාලනය කරනු ලබන රාජ්‍යයයි. තෘෂ්ණාවෙන් හා බල කාමයෙන් මත් ව අධාර්මික ආකාරයට තම රට වැසියන් පාලනය කරනු ලබන රජු බුදුසමයෙන් බැහැර කර ඇත. පෙර සියලු රටවැසියන්ට දැහැමින් සත්කාර කරමින් රාජ්‍ය විචාළ දල්හනේමි නම් රජ කෙනෙක් පිළිබඳ ව දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේහි සඳහන් වේ. දල්හනේමි රජුට සප්ත රත්නයක් විය.

1. චක්‍රරත්නය
2. හස්ති රත්නය
3. අශ්ව රත්නය
4. මණි රත්නය
5. ස්ත්‍රී රත්නය
6. ගෘහපති රත්නය
7. පරිනායක රත්නය යනුවෙනි.

මෙම රත්නයන්ගෙන් යුත් රජු ජනතාවගේ හිත් දිනා ගනිමින් දඬුවමින් තොර ව දැහැමින් රාජ්‍ය විචාළබව චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වේ. දල්හනේමි රජු තමාගේ පුත්‍රයාට රාජ්‍ය ලබා දී පැවිදි වී දින හතකින් සප්ත රත්නය අතුරුදන් විය. පිය රජුගෙන් මේ පිළිබඳ විචාරා සිටි අවස්ථාවේ රාජ්‍යය යනු පියාගෙන් පුතාට හිමි වන දායාදයක් නො වනබවයි. පියාගෙන් අවවාද ලබා ගැනීමට පැමිණි පුත්‍රයාට නිසි පරිදි සක්විතිවත් පුරන ලෙසත් පොහෝදා හිස සෝදා නා පෙහෙවස් සමාදන් වී සිල් ආරක්ෂා කරන ලෙසත් එවිට චක්‍රරත්නය පහළ වනබවත් පෙන්වා දුන්නේ ය. ආරක්ෂා කළ යුතු දස සක්විතිවත් කවරේද යන්න විමසා සිටි අවස්ථාවේ මේ අයුරින් දැක්වීය.

> රජු රට වැසියා ආරක්ෂා කරනවිට රට වැසියා ද රජු පිළිබඳ ධාර්මික ව සලකා කටයුතු කරයි. පාලක පාලිත දෙපිරිසගේ අන්‍යෝන්‍ය සුහදතාව මත සියල්ලන් තුළ සාධාරණත්වය ස්ථාපිත වනබව පැහැදිලි ය

1. පාලකයා දැහැමි වීම.
2. අඹුදරුවන් දැහැමින් පෝෂණය කිරීම
3. බලසේනාව දැහැමින් පෝෂණය කිරීම
4. ක්ෂත්‍රිය ජනයා දැහැමින් පෝෂණය කිරීම
5. බ්‍රාහ්මණ ගෘහපතියන් දැහැමින් පෝෂණය කිරීම
6. නියම් ගම් ජනපදවාසීන් දැහැමින් පෝෂණය කිරීම
7. මහණ බමුණන් දැහැමින් පෝෂණය කිරීම
8. මෘග පක්ෂීන් දැහැමින් පෝෂණය කිරීම
9. ධනය නැති පිරිසක් වේද ඔවුන්ට ධනය සැපයීම

10.වරින් වර මහණ බමුණන් වෙත ගොස් උපදෙස් ලබාගැනීම

ධාර්මික ව යුක්තිගරුක ව රාජ්‍ය විචාරන්නේ නම් මේ අනුව සිදු කළයුතු ව ඇතිබව පැහැදිලි ය. සමාජයේ ජීවත්වන සියලු දෙනාට ම සමාන ව සලකමින් රාජ්‍ය පාලනය ගෙන යන්නේ නම් එය යුක්ති සහගත රාජ්‍යයකි.

අංගුත්තර නිකායේ ධම්මරාජ සූත්‍රයේ සඳහන් පරිදි භික්ෂු පිරිසක් බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසූහ. ස්වාමිනි, ධාර්මික වූ සක්විති රජු කෙසේ රජවෙයි ද? යනුවෙනි. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ ඔහුට නායකත්වය ධර්මය විසින් ලබා දෙනබවයි. ධර්මය අනුගමනය කරන දැහැමි පාලකයෙකු මේ අනුව කටයුතු කළයුතු ව ඇත. ධර්මයට සත්කාර කරමින් ධර්මයට ම ගරු කරමින්, ධර්මයට ම බුහුමන් කරමින්, ධර්මයට ම පුදමින් ධර්මයට ම යටත් පැවතුම් දක්වමින් ධර්මය ම ධජයක් සේ පෙරටු කොට ගෙන ධර්මය ම කොන්තයක් සේ ඔසවා ගෙන ධර්මය ම ආධිපත්‍ය කොටගෙන එම සක්විතිවත්වල යෙදෙන ලෙස ය.

**"........ ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරංතෝ ධම්මං ගරු කරන්තෝ ධම්මං මානෙන්තෝ ධම්මං පූජෙන්තෝ ධම්මං අපමාය මානෝ ධම්ම ධජෝ ධම්ම කේතු ධම්මාධිපතෙය්‍ය ධම්මිකා රක්ඛාවරණ ගුත්තිං සංවිදතංසු"**

දී.නි., සසසල චක්කවත්ති සීහනාද සූත්‍රය, 100 පිටුව.

තමාට හැකියාව තිබෙන නිසා තම හැකියාවෙන් සියල්ලන්ට ගරු කරමින් ධර්මානුකූල ව සියල්ල පාලනය කළ යුතු ය. තවද ධාර්මික ව චක්‍රරත්නය ආරක්ෂා කරමින් කටයුතු කරනු ලබන රජු ප්‍රාදේශීය රාජ්‍යයන් ද මේ අයුරින් ධාර්මික ව පවත්වා ගෙන යයි.

1. පාණෝ න හන්තබ්බෝ
   - සත්ව ඝාතනය නො කළ යුතුය.
2. අදින්නං න ආදාතබ්බං
   - නොදුන්දේ පැහැරනොගත යුතුය.
3. කාමේසු මිච්ඡා න චරිතබ්බං
   - කාමය වරදවා නො හැසිරිය යුතුය.
4. මුසා න භාණී තබ්බං
   - අසත්‍ය වචන නො කිවයුතුය.
5. සබාතුත්තඤ්ච දඤ්ඡවානි
   - තමන් පරිභෝග කළ පරිද්දෙන් ධාර්මිකව පරිභෝජනයේ යෙදෙන්න.

මේ අයුරින් රටෙහි රජු ධර්මයට ගරු කරමින් ධාර්මික ව ක්‍රියා කළයුතු වේ. රජු රට වැසියා ආරක්ෂා කරනවිට රට වැසියා ද රජු පිළිබඳ ධාර්මික ව සලකා කටයුතු කරයි. පාලක පාලිත දෙපිරිසගේ අන්‍යෝන්‍ය සුහදතාව මත සියල්ලන් තුළ සාධාරණත්වය ස්ථාපිත වනබව පැහැදිලි ය.

එමෙන් ම අංගුත්තර නිකායේ පඨම චක්කානුවත්තන සූත්‍රයේදී සක්විති රජකු බවට පත්වීම සඳහා පැවතිය යුතු ලක්ෂණ පහක් දක්වයි. තුන්කාලයට ම අයත් පාලන ප්‍රතිපත්තියක් හෙවත් ලක්ෂණ වශයෙන් මේවා අගය කළ හැකිය.

1. අත්ථඤ්ඤු - අර්ථය හෙවත් රටවැසියාගේ යහපත, දියුණුව, සංවර්ධනය නැතහොත් ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳීමට ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ග පිළිබඳ වැටහීම.

2. ධම්මඤ්ඤු - රාජධර්ම හෝ රටේ බලපවත්නා නීති චාරිත්‍ර සම්ප්‍රදාය දැනීම.


3. මත්තඤ්ඤු - තම පමණ දැන ක්‍රියා කිරීම හෙවත් පාලන තන්ත්‍රයේ සෑම අංශයක් කෙරෙහි ම ව්‍යාප්ත ව තිබියයුතු හික්මීම

4. කාලඤ්ඤු - කාලීන අවශ්‍යතා කාලීන ප්‍රශ්න හොඳින් දැන සිටීම

5. පරිසඤ්ඤු - ජනගහනය, ජනතා ප්‍රවණතාවන්, එහි ස්වභාවය, අපේක්ෂා ආදිය හඳුනා ගැනීම

මෙම චක්‍රවත්ති සංකල්පය ක්‍රියාත්මක කළවිට අධර්මයෙන් තොර, අසත්‍යයෙන් තොර, අවිආයුධවලින් තොර ජනහිතකාමී පාලනයක් ගොඩනැගිය හැකිබව පැහැදිලි ය.

**ආචාර්ය රාජකීය පණ්ඩිත**
**මැටිබැඹියේ ධම්මසිරි හිමි**



# සාර්ථක පවුල් ජීවිතයක් උදෙසා...

විශාකා සිටු දේවිය යනු, රන් රුවක් බඳු වූ මනා රූප සම්පත්තියෙන් සපිරුණු පුණ්‍යවන්ත කාන්තාවකි. කුඩා කල සිටම මනා සංවරශීලි ගතිපැවතුම් සමුදායකින් හෙබියා වූ මේ කුමරිය, නිසි වයස් එළැඹුණු පසු කුල පුත්‍රයෙකු සමඟ සරණ බන්ධනයට පිවිසුණි. ඇයගේ විවාහ මංගල්‍යයට කලින් දින රාත්‍රියෙහි සිය පියාණන් වූ ධනංජය සිටුතුමන් විසින් පවුල් ජීවිතය යහපත්ව පවත්වා ගන්නට අවැසි වටිනා කරුණු දහයකින් සමන්විත අවවාද මාලාවක් ඇය වෙත ලබා දුනි. ඒවා මෙසේයි.

01. ඇතුළත ගිනි පිටත නොදිය යුතුය
02. පිටත ගිනි ඇතුළට නොගත යුතුය.
03. දෙන්නන්ට දිය යුතුය.
04. නොදෙන්නන්ට නො දිය යුතුය.
05. දෙන්නන් හටත් නො දෙන්නන් හටත් දිය යුතුය.
06. සුවසේ හිඳිය යුතුය.
07. සුවසේ අනුභව කළ යුතුය.
08. සුවසේ නිදිය යුතුය.
09. ගිනි පිදිය යුතුය.
10. ඇතුළත දෙවියන් පිදිය යුතුය.

මෙහි පළමු කාරණයෙන්, එනම් ඇතුළත ගිනි පිටතට නො දිය යුතුය යන කරුණෙන් ප්‍රකාශ වන්නේ, කුල කාන්තාවක් නැතහොත් යම් තරුණියක් විවාහ දිවියට ඇතුළත් වූ පසු පෙර සිරිත අනුව ස්වාමියාගේ නිවසට පදිංචිය පිණිස ගිය කල්හි, එහි වෙසෙන තම ස්වාමිපුරුෂයාගේ හෝ ඔහුගේ ආදරණීය දෙමාපියන්ගේ කිසිදු අඩුපාඩුවක් අන් අය හමුවේ නොකිය යුතුය යන්නයි. එසේ කිරීම යම් දිනක තමන්ටම අහිත පිණිස හේතු වන්නක් වන බැවිනි.






දෙවැනි කරුණ පිටත ගිනි ඇතුළට නොගත යුතුය යන්නයි. එනම්, අසල්වැසි නිවෙස්වල පිරිසි මෙන්ම ඥාති මිත්‍රාදීන්ගේ අගුණ දුර්වලකම් තම නිවෙස තුළට ගෙන බොහෝ කරදරවලට පත්ව ඇති පිරිස් කොතෙකුත් නම් මේ සමාජයේ සිටිත්ද? එබැවින් තම පවුල් ජීවිතය මෙන්ම ඒ ආශ්‍රිත පරිසරය යහපත්ව පවත්වා ගන්නට එය මහත් සේ උපකාරී වන බව හොඳින් වටහා ගෙන ක්‍රියා කළ යුතු වේ.


තුන්වන කරුණ වන දෙන්නන්ට දිය යුතුය යන්නෙන් කියැවෙන්නෙ, යමෙක් නැවත තමන්ට ලබාදීමේ පදනමින් ණය මුදලක් හෝ වෙන යමක් ඉල්ලා ගතහොත් එය නැවත අමතක නොකර තමන් වෙත ලබා දෙන අයට පමණක් එය ලබා දිය යුතු යන්නයි. එයද පවුල් ජීවිතය යහපත්ව පවත්වා ගන්නට මහත් සේ උපකාරී වන්නකි.

> එදා සමාජයේ මෙන්ම වර්තමානයේ දී ද තම දෙපය වෙහෙසා යමක් උපයා ගන්නට හැකියාවක් තිබෙන අයවලුන් පවා අනුන්ගෙන් යැපෙන්නට පෙළඹී සිටී. අනෙකාට කුමන ගැටළුව මතු වුණද එයින් තමන්ට අත් වන්නේ වාසියක් නම් ඒ පිළිබඳ පමණක් සිතා මිනිසුන්ගෙන් උදව් උපකාර ලබාගෙන අමතක කර දමන එවැනි අය හොඳින් හඳුනාගෙන බුද්ධිමත්ව ක්‍රියා කළ යුතු බව එයින් කියැවේ.

හතරවැනි කරුණ වන නොදෙන්නන් හට නොදෙව යන්නෙන් අදහස් කරන්නේ, යම් ණය මුදලක් හෝ යමක් ඉල්ලාගෙන ඒවා නැවත ලබා නොදෙන්නන් හට කිසිවක් නොදෙන ලෙසය. එදා සමාජයේ මෙන්ම වර්තමානයේ දී ද දෑත දෙපය වෙහෙසා යමක් උපයා ගන්නට හැකියාවක් තිබෙන අයවලුන් පවා අනුන්ගෙන් යැපෙන්නට පෙළඹී සිටී. අනෙකාට කුමන ගැටළුව මතු වුණද එයින් තමන්ට අත් වන්නේ වාසියක් නම් ඒ පිළිබඳ පමණක් සිතා මිනිසුන්ගෙන් උදව් උපකාර ලබාගෙන අමතක කර දමන එවැනි අය හොඳින් හඳුනාගෙන බුද්ධිමත්ව ක්‍රියා කළ යුතු බව එයින් කියැවේ. බොහෝ දෙනා හදිසි අවස්ථාවක් යැයි හෝ කියමින් ණය මුදලක් හෝ යම් බඩු බාහිරාදිය ඉල්ලා ගෙන අමතක කරමින් එය නැවත ලබා නොදීම හේතුවෙන් පවුල් තුළ නොයෙකුත් ප්‍රශ්න මතුවේ. එය තමාගේ ධන හානියටද හේතු වෙයි. යහපත් පවුල් ජීවිතයකට මං පාදා ගනු පිණිස එවැනි පුද්ගලයින් දුරින් දුරු කළ යුතු බව එයින් කියැවේ. පස්වන කරුණ වන්නේ දෙන්නන් හටත් නො දෙන්නන්ටත් දිය යුතුය යන්නයි. එමගින් කියැවෙන්නේ අසරණ, දුප්පත්, ඥාතීහු, හිතවත්තු අපට සිටිති. නැති බැරිකම මෙන්ම නොයෙකුත් කරදර හමුවේ ඔවුහු ඉතා දුෂ්කර ජීවිත ගත කරති. එබඳු ඥාති මිත්‍රාදීන්ට යම් මුදලක් හෝ වෙනයම් දෙයක් හෝ ලබා දීම සුදුසු බවයි. එය ඥාති සංග්‍රහයක් ලෙස සලකා හැකි පමණින් ඔවුන්ට උදව් උපකාර කිරීම තමාටත් පවුලේ සමගියටත් හේතු වේ.

හයවන කරුණ වන්නේ සුවසේ හිඳිය යුතුය යන්නයි. වැඩිහිටි ගෞරවය පිළිබඳ දන්නා හඳුනන අය උස් ආසනයක හිඳගෙන සිටියේ නම්, යම් වැඩිහිටියෙකු දුටු විට හුනස්නෙන් නැගී සිටී. එලෙස වැඩිහිටියෙකු දැක, විටින් විට හුනස්නෙන් නැගී සිටීමට සිදු නොවන පරිදි, නිවසේ හෝ වෙන යම් තැනක සුදුසු ආසනයක් තෝරා ගෙන හිඳගත යුතු බව එයින් කියැවේ. එසේ නොකරන්නේ නම් ඇය කිසි ගරුසරුවක් නැති අයෙක් ලෙස වැඩිහිටියන්ගේ දෝෂ දර්ශනයට ලක් වේ.

සත්වැනි අවවාදය නම්, සුවසේ අනුභව කළ යුතුය යන්නයි. එනම් නිවසේ තම ස්වාමියාට, ඥාතීන්ට මෙන්ම දැසි දස්සන්ට ආහාර පාන නිසි ලෙස ලැබී ඇත්දැයි සොයා බලා, තමන් ආහාර අනුභව කිරීම කළ යුතු බවයි. මෙයින් තවදුරටත් පැහැදිලි වන්නේ එදා සමාජයේ ගෘහණිය තම ස්වාමිපුරුෂයාට මෙන්ම ඥාති වර්ගයාට ද, දැසිදස්සන්ට ද සළකමින් ඔවුන්ගේ ආහාර පාන පිළිබඳව සොයා බැලීම පමණක් නොව ගෙදර දොර සකලවිධ පරිපාලන කටයුතු සොයා බැලූ ආදර්ශවත් ගෘහණියක් බවයි.



අට වැනි අවවාදය වන්නේ, සුවසේ නිදා ගත යුතුය යන්නයි. තමන්ගේ නැන්දා මාමා දෙපළට ලේලියක වශයෙන් කළ යුතු සැළකිලි නිසි ලෙස දක්වා, සිය නිවසේ දොර ජනෙල් නිසි ලෙස වසා ඇත්දැයි සොයා බලා අවසානයේ තමන් නින්දට යාම සියළුම දෙනාගේ ආරක්ෂාවට ද හේතුවක් වන බැවිනි. එයින් සොර සතුරු උවදුරු නැති කර ගැනීමටත්, සැමගේ ජීවිතාරක්ෂාව මෙන්ම හරි හම්බකරගත් ධනය හා අනෙකුත් සියල්ල ආරක්ෂා කර ගැනීමටත් හැකිවන අතර, එකී වකීම යහපත් ගෘහණියක් වෙත පැවරී ඇති බව කියැවේ. එලෙස ක්‍රියා කරන ගෘහණිය තම ස්වාමියාගේ මෙන්ම ඥාති වර්ගයාගේම ගෞරවාදරයට පාත්‍ර වේ.

තම ආදරණීය භාර්යාව මෙලෙසින් පිළිපදින විට නරක යැයි කියන කවර හෝ ස්වාමිපුරුෂයෙකු හික්මවා ගන්නට හැකිවනවා නො අනුමානය. වර්තමානයේ පවුල් ජීවිතවල ප්‍රශ්න බොහෝ ය. අඹු සැමියන්ගේ ක්‍රියාකලාපයන් නිසා අනාථයන් බවට පත් වූ දරුවන් ද බොහෝ ය.

නව වැනි අවවාදය ලෙස දක්වන්නේ ගිනි පිදිය යුතුය යන්නයි. එනම් තම ස්වාමිපුරුෂයාගේ දෙමාපියන් ඇතුළු වැඩිහිටි ඥාතීන්ට යටහත් පහත්ව ගරු සරු ඇතිව ක්‍රියාකළ යුතු බවයි. විවාහ ජීවිතයකට ඇතුළුවන තරුණියක් තම දෙමාපියන්ගෙන් වෙන්ව ගමන් ගන්නේ, වෙනත් පරිසරයක අලුත් ඥාතීන් පිරිසක් හමුවටය. එහිදී ඔවුන් ඉක්මවා නොගොස් වැඩිහිටි ගෞරවය පරිදි යටහත් පහත්ව වෙසෙමින් ඔවුන් හට නිසි ගෞරවය දැක්වීමම, ඒ සියල්ලන්ගේම ගෞරවාදරයට පාත්‍ර වීමට හේතුවක් වන බවයි.

දසවැනි අවවාදය වන්නේ, ඇතුළත දෙවියන් පිදිය යුතුය යන්නයි. එනම් තම ස්වාමිපුරුෂයාට ගරු සරුව ඇතිව සුහදශීලි භාර්යාවක් ලෙස ක්‍රියා කළ යුතු ය යන්නයි. ඔහු අතින් යම්කිසි වරදක් සිදු වුවද, සැණින් කෝපයට පත් නොවී, බුද්ධිමත්ව සිතා, සුදුසු කල් බලා එම වරද ඔහුට වටහා දිය යුතු බවත් ය. ඉවසිලිවන්තව හා ඉතා බුද්ධිමත්ව සියලු ගැටළු නිරාකරණය කර ගන්නට යහපත් භාර්යාවක් සමත් විය යුතුය. වර්තමානයේ පවුල් ජීවිත දෙදරා යාමට ප්‍රධාන ම හේතුවක් වී ඇත්තේ ද එකිනෙකා පිළිබඳ ගෞරවයක් නොමැති වීමත්, ගැටළුවක් මතු වූ විගස ඉසිලිවන්තව බුද්ධිමත්ව ඒවා විසඳා ගැනීමට නොහැකිවී ඇති නිසාත් ය.

විශාකා සිටු දේවියගෙන් ප්‍රකට වුණු එකී උතුම් ගුණාංග ගෘහ ජීවිතය ගත කරන සෑම කාන්තාවකටම බෙහෙවින් ම ප්‍රයෝජනවත් වේ. තම ආදරණීය භාර්යාව මෙලෙසින් පිළිපදින විට නරක යැයි කියන කවර හෝ ස්වාමිපුරුෂයෙකු හික්මවා ගන්නට හැකිවනවා නො අනුමානය. වර්තමානයේ පවුල් ජීවිතවල ප්‍රශ්න බොහෝ ය. අඹු සැමියන්ගේ ක්‍රියාකලාපයන් නිසා අනාථයන් බවට පත් වූ දරුවන් ද බොහෝ ය. ඉහතින් දක්වා ඇති අවවාදයන් නූතන සමාජයට ද ආදේශ කර ගන්නේ නම්, එකී දුක්ඛදායක තත්ත්වයෙන් අත මිදීමට ඇති එකම මග ද එයම වනු ඇත.

**පූජ්‍ය බදුල්ලේ**
**මහානාම ස්වාමින් වහන්සේ**

කුල කත
ගෙන දෙයි සිරිකත



# කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය 4

## බුදු දහම උපාසිකාවක ලෙස කාන්තාව ඇගයීමට ලක් කළ අයුරු

ක්‍රි. පූ. 6 වන සියවසේ බුදුරජාණන් වහන්සේ මෙලොව පහළ වන අවධිය වනවිට භාරතීය සමාජය තුළ කාන්තාවට හිමිව පැවතියේ ඉතාමත් පහත් ස්ථානයකි. බ්‍රාහ්මණ පූජකයන් විසින් අසහාය බලධාරී මහාබ්‍රහ්මන් නම් වූ දෙවියන් වහන්සේගේ ඉගැන්වීම් යැයි පවසමින් සමාජයේ හිමිවිය යුතු බොහෝ වරප්‍රසාද භාරතීය කාන්තාවට අහිමි කරනු ලැබීය. කාන්තාව විෂයයෙහි ඔවුන් පනවා තිබූ ඇතැම් නීතිරීති මූලික මිනිස් අයිතිවාසිකම් පවා උල්ලංඝනය වන ආකාරයේ ඒවා විය. ඒ අනුව පූර්ව වෛදික යුගයේ කාන්තාවට හිමිව පැවති සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික හා අධ්‍යාපනික අයිතීන් බ්‍රාහ්මණ යුගයේ ආරම්භයත් සමග නිර්දය ලෙස අහෝසි විය. විශේෂයෙන්ම ආගමික අයිතීන් සීමාවකට ලක්කිරීම නිසා බ්‍රාහ්මණ යුගයේ ජීවත් වූ කාන්තාවෝ බොහෝ පිරිසක් මානසික වශයෙන් අසහනකාරී දිවිපෙවෙතක් ගත කරන්නට වූහ.

බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව කාන්තාව යනු අපිරිසිදු තැනැත්තියකි. මේ නිසා ශුද්ධ ස්ථානවලට කාන්තාවන් නොයා යුතුය. එසේ ගිය හොත් එම ස්ථාන අපිරිසිදු තත්ත්වයට පත් වන බවත් දෙවියන් එම පුද පූජාවන් භාර නොගන්නා බවත් බ්‍රාහ්මණ ඉගැන්වීම විය. මේ නිසා ආගමික වශයෙන් සිදු කරන යාගහෝමවලට සම්බන්ධ වීමට භාරතීය කාන්තාවන්ට නොහැකි විය. වේද මන්ත්‍ර සජ්ඣායනය පවා කාන්තාවට තහනම් විය. යම් තැනැත්තියක වේද මන්ත්‍ර ගායනා කළහොත් ඇයට දැඩි දඬුවම් පමුණුවනු ලැබීය. එමෙන්ම කාන්තාව දෑගුල් නුවණැති අඥාන තැනැත්තියක වන නිසා විමුක්තිය ළඟා කර ගැනීමට නොහැකි බව බ්‍රාහ්මණ ඉගැන්වීම විය. මේ ආකාරයට බ්‍රාහ්මණ ආධිපත්‍යය තුළ කාන්තාවට ආධ්‍යාත්මික වශයෙන් ප්‍රගතියක් ඇති කරගැනීමට අවශ්‍ය මාර්ගය අහුරා ඇත. ඒ බව මනුස්මෘතියේ එන පහත ශ්ලෝකය පිළිබඳ විමසීමෙන් වඩාත් පැහැදිලි කර ගත හැකිය.

**"නාස්ති ස්ත්‍රීණාං පෘථග් යඥෝ - න ව්‍රතං නාප්‍යුපෝෂණම් පතිං ශුශ්‍රෑෂතෙ යේන - තේන ස්වර්ගේ මහීයතේ"**

(මනුස්මෘතිය, v - 155)

ඉහත ශ්ලෝකයට අනුව කාන්තාවට ඔවුන් සඳහා වෙන්වූ යාගහෝම හෝ ආගමික චාරිත්‍ර කිසිවක් නොමැත. ඇයට විමුක්තිය ළඟාකර ගැනීමට ඇති ඒකායන මාර්ගය වන්නේ විවාහ බන්ධනය සහ ස්වාමියාට කීකරුව විසීම පමණක් බව බ්‍රාහ්මණ මතය විය. මේ නිසා භාරතීය කාන්තාවන් බොහෝදෙනෙකු තම ස්වාමියාගෙන් සිදුවන අනේක විධ හිරිහැර කරදර විඳදරා ගනිමින් දුක්ඛිත ජීවිතයක් ගතකරනු ලැබීය.

මෙවැනි සංකීර්ණ සමාජ වටපිටාවක් තුළ පීඩාකාරීව ජීවත් වූ භාරතීය කාන්තාවට ආගමික වශයෙන් යම් සහනශීලි පසුබිමක් නිර්මාණය වූයේ බුදුදහමේ උදාවත් සමග ය. එහිදි කාන්තාවගේ සමාජීය තත්ත්වය උසස් කර උපාසිකාවක ලෙස ඇගයීමට ලක්කර තිබීම විශේෂ වූවකි. සංයුත්ත නිකායේ වඩ්ඪී සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට මෙලොවිහි යම් ස්ත්‍රියක් සැදැහැයෙනුත්, සීලයෙනුත්, ප්‍රඥාවෙනුත්, ත්‍යාග - ශ්‍රැත යන පඤ්ච ගුණයෙන් වැඩේ ද, එබඳු සිල්වත් ඒ උවැසි තොමෝ මේ අත් බැව්හි තමාගේ සාරය ගන්නා බව පහත පරිදි දක්වා ඇත.

**"සද්ධාය සීලෙන ච යාධ වඩ්ඪති**
**පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං**
**සා තාදිසී සීලවතී උපාසිකා**
**ආදියති සාරං ඉධෙව අත්තනොති"**

ඒ අනුව ශ්‍රද්ධාවෙන් යුක්තව බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය වෙත එළඹ, තෙරුවන් ඇසුරු කරමින් දැහැමිව සිල්වත් ජීවිතයක් ගත කරන කාන්තා පිරිස හැඳින්වීම සඳහා උපාසිකා යන වචනය බුදුදහමේ භාවිත කර ඇත. බ්‍රාහ්මණ සමාජයෙහි ගෘහස්ථ වශයෙන් නොලද ආගමික අයිතීන් රැසක් මෙමගින් කාන්තාවට ලැබී ඇත. ගෘහස්ථ හා සමාජීය වශයෙන් ලද පීඩාකාරීබවින් මිදී ආධ්‍යාත්මික වශයෙන් ප්‍රගතියක් ඇති කරගැනීමට මේ නිසා භාරතීය කාන්තාවට හැකි විය. විශාඛා මහ උපාසිකාව වැනි කාන්තාවෝ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම මෙම නිදහස ලැබුවෝ ය. කාන්තාව අඥාන යැයි යන මතය ඇය බණ්ඩනය කළේ සත් හැවිරිදි වියේ ම සෝවාන් ඵලයට පත් වීම මගිනි. බුදු සසුනේ අභිවෘද්ධිය උදෙසා සුවිශාල මෙහෙවරක් ඉටු කළ ඇයට අග්‍ර දායිකා තනතුර ලබා දුන්නේ සුදුසු පරිදි කාන්තා අයිතිවාසිකම් ලබාදීම පිළිබිඹු කරමිනි.

එමෙන් ම සේනානිගම සුජාතා උපාසිකාව පළමුවෙන්ම බුදුන්සරණ ගිය උපාසිකාවන් අතර අග තනතුර ද, ඛුජ්ජුත්තරා උපාසිකාව බහුශ්‍රැතාවන් ගේ අග තනතුර ද, නකුල මාතා උපාසිකාව විශ්වාස කථා ඇත්තියන් ගේ අග තනතුර ද, සුප්පියා උපාසිකාව ගිලානෝපස්ථාන උපාසිකාවන් අතරින් අග තනතුර ද, උත්තරා නන්දමාතා උපාසිකාව ධ්‍යාන වඩන තැනැත්තියන් අතර අග තනතුර ද, සාමාවතී රාජ දේවිය මෛත්‍රී ධ්‍යාන සිතින් වාසය කරන්නියන් අතරින් අග තනතුර ද, කාතියානි උපාසිකාව අචල පැහැදීමෙන් යුතු උපාසිකාවන් අතර අග

අංගුත්තර නිකායේ උපාසිකා සූත්‍රයේදී නිරයේ ඉපදීමට හේතුවන කරුණු දහයකුත් ස්වර්ගයේ ඉපදීමට හේතුවන කරුණු දහයකුත් දේශනා කර ඇත්තේ උපාසිකාවක ලෙස ලබාගත යුතු ආධ්‍යාත්මික ශික්ෂණය උපරිම ආකාරයෙන් ලබා ගැනීමට මග පෙන්වීමක් වශයෙනි.

තනතුර ද, කෝලිය ධීතු සුප්පාවාසා උපාසිකාව ප්‍රණීත දන්පැන් පුදන්නියන් අතර අග තනතුර ද ආදි වශයෙන් තනතුරු හිමි කරගත්තේ බුදුදහමින් ලබාදුන් ආගමික නිදහස මූලික කර ගනිමිනි.

මේ අනුව ආගමික වශයෙන් ලබා ගන්නා වූ ආධ්‍යාත්මික හික්මීම මගින් යහපත් සමාජයක් ගොඩනැගීමට කාන්තාවට ද මහඟු දායකත්වයක් සැපයිය හැකි බව බුදුදහමින් මොනවට පෙන්වා ඇත. දරුවන් නිවැරදි ලෙස සමාජානුයෝජනය කිරීම, ගේදොර වැඩකටයුතු මනාව කළමනාකරණය කරගැනීම හා සාමාජීය වශයෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීමට කාන්තාවකට හැකිවන්නේ නිරවුල් කායික හා මානසික පසුබිමක් පැවතිය හොත් පමණි. එම නිරවුල් කායික මානසික සුවතාව ඇති කර ගැනීම විෂයයෙහි කාන්තාවට

උපාසිකාවක ලෙස සිය චරිතය හැඩගස්වා ගත යුතු ආකාරය බුදුදහමින් මැනවින් පෙන්වා දී ඇත. අංගුත්තර නිකායේ උපාසිකා සූත්‍රයේදී නිරයේ ඉපදීමට හේතුවන කරුණු දහයකුත් ස්වර්ගයේ ඉපදීමට හේතුවන කරුණු දහයකුත් දේශනා කර ඇත්තේ උපාසිකාවක ලෙස ලබාගත යුතු ආධ්‍යාත්මික ශික්ෂණය උපරිම ආකාරයෙන් ලබා ගැනීමට මග පෙන්වීමක් වශයෙනි.

**නිරයේ ඉපදීමට හේතුවන කරුණු**

1. සතුන් මරන්නේ වේ.
2. සොරකම් කරන්නේ වේ.
3. කාමයන්හි වැරදි හැසිරීම් ඇත්තේ වේ.
4. බොරු කියන්නේ වේ.
5. කේලාම් කියන්නේ වේ.
6. ඵරුෂ වචන ඇත්තේ වේ.
7. හිස් වචන දොඩන්නේ වේ.
8. දැඩි ලෝබකම ඇත්තේ වේ.
9. ක්‍රොධ සිත් ඇත්තේ වේ.
10. වැරදි දැකීම් ඇත්තේ වේ.

**ස්වර්ගයේ ඉපදීමට හේතුවන කරුණු**

1. සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ.
2. සොර කමින් වෙන්වූයේ වේ.
3. කාමයන්හි වැරදි හැසිරීමෙන් වෙන්වූයේ වේ.
4. බොරු කීමෙන් වෙන්වූයේ වේ.
5. කේලාම් කීමෙන් වෙන්වූයේ වේ.
6. ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වේ.
7. හිස් වචනයෙන් වෙන්වූයේ වේ.
8. තද ලෝබකම නැත්තේ වේ.
9. ක්‍රෝධ සිත් නැත්තේ වේ.
10. නිවැරැදි දැකීම ඇත්තේ වේ.

එමෙන්ම අංගුත්තර නිකායේ උපාසක පරිහානිය සූත්‍රයයෙහි උපාසක උපාසිකාබව නැති වීමට බලපාන හේතු 7ක් ද පෙන්වා දී ඇත. එනම්,



1. භික්ෂූන් වහන්සේලා දැකීමට අකැමැති වේද,
2. බණ දහම් ඇසීමට ප්‍රමාද වේද,
3. අධිශීලයෙන් (ඉහළ සිල්වලින්) නොහික්මේද,
4. අප්‍රසාද බහුල වූයේ වේද,
5. ස්ථවිරවූ ද මධ්‍යමවූ ද නවකවූ ද භික්ෂූන් වහන්සේලා කෙරෙහි සිදුරු සොයමින් දොසක් කීමේ අදහසින් බණ දහම් අසන්නේ ද,
6. මේ ශාසනයෙන් පිටත දන්දීමට සුදුස්සන් සොයා ද,
7. ඒ බාහිරකයන්ට මුලින් දී පසුව භික්ෂූන්ට දේ ද,

එවැනි අයගේ උපාසක බව පිරිහීමට පත් වේ. ඉහත ලක්ෂණයන්ගෙන් ඈත්ව ධර්මානුකූලව කටයුතු කිරීමෙන් සද්ධර්මයෙන් නොපිරිහෙන උපාසිකාවක්බවට පත්වීමට කටයුතු කළයුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. ආගමානුකූලව දැහැමිව කටයුතු කිරීමෙන් ඇති කරගන්නා ආධ්‍යාත්මික ශික්ෂණය, බියෙන් සැකයෙන් තොර සාර්ථක ගිහි ජීවිතයක් ගතකිරීමට මෙන්ම පරලොව සුගති සඳහා ද හේතු වේ. මෙලෙස බුදුදහම මගින් උපාසිකාවක ලෙස කාන්තාව ඇගයීමට ලක්කරමින් කාන්තා අයිතීන් සුරක්ෂිත කරලීමට කටයුතු කර ඇති බව පැහැදිලි වේ.

**ආචාර්ය එම්.ඩබ්ලිව්. දුලීකා හර්ෂණී**

# කුහක ජාතකය

පන්සිය පනස් ජාතක කතා පොත් වහන්සේ පෙරදිග සාහිත්‍ය තුළ ඉතා ජනප්‍රිය, බෞද්ධයන්ගේ මුදුන් මල්කඩක් බඳු කෘතියකි. සිංහල සාහිත්‍යයේ ප්‍රගමනයට ද බොහෝ සෙයින් දායක වූ මෙම කෘතිය බෝසත් චරිත කතා සංග්‍රහයක් පමණක් නොව මිනිසුන්ගේ සිතුම් පැතුම්, ගති පැවතුම් ද මොනවට පිළිබිඹු කරන්නකි. මනුෂ්‍ය චරිත විනිවිද දැකීමට ද ජාතක කතා පොත් වහන්සේ බෙහෙවින් උපකාරී වෙයි.

පන්සිය පනස් ජාතක කතා පොතෙහි අසූ නවවන ජාතක කතාව වන කුහක ජාතකය තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි කොහොන්තපස් රකින්නා වූ එක්තරා භික්ෂූන් වහන්සේ කෙනෙක් අරභයා වදාළ සේක. ඒ භික්ෂුව සිව්පසය නිසා තුන් වැදෑරුම් වූ කුහක ගුණ පුරන බව දිනක් දම්සභා මණ්ඩපයෙහි ඇති වූ කතාබහකින් පසු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා පෙරත් ඔහු එසේ ම යැයි පවසා මෙම ජාතක කථාව දේශනා කළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රජකම් කරන කාලයේ එක්තරා කුඩා ගමක් ඇසුරු කර ගෙන හොර තපස් රකින ජටාවක් දරන එක්තරා තාපසයෙක් වාසය කරන්නට විය. එක්තරා ධනවත් තරුණයෙක් එම තාපසයා කෙරෙහි පැහැදීමක් ඇති කර ගෙන එම තාපසතුමාට පන්සලක් කරවා පූජා කර වූයේ ය. දන්පහන් ආදියෙන් ද අඩුවක් නොකරයි. නිතර නිතර ඇප උපස්ථාන කරනු ලබයි. තරුණ ධනවතාගේ ඇප උපස්ථාන ලබන තාපසයාණන් ද දවසින් දවස තමාගේ ශීල ගුණ ධර්ම වැඩි දියුණු කරගන්නා බව තරුණ ධනවතාට පෙනේ. තරුණ ධනවතා අසීමිත ලෙස පැහැදීමට පත් වෙයි. තාපසයාණන් ද තමන්ට ලැබෙන දානමාන ආදියෙන් සැතපෙමින් තම උතුම් ගුණධර්ම සුරකින බව පෙන්වයි.



ඔහු කෙරෙහි පැහැදී සිටි තරුණ ධනවතා මෙම තාපසයා ඉතා සිල්වත් කෙනෙකු යැයි සිතා සොර සතුරන්ට භයින් තමා තුළ තිබූ රත්රන් මැණික් සියයක් ඒ තාපසයාණන් වසන පන්සලට ගෙන ගොස් එහි නිධන් කොට "ස්වාමීනි මෙතන මෙපමණ වස්තුව තිබේ. එය මැනවින් බලා ගනු මැනවි" තාපසයාණන්ට කීය. එවිට තාපසතුමා එම ධනවත් තරුණයාට ප්‍රකාශ කර සිටියේ "පින්වත, බඩු තැන්පත් කොට තබා ගැනීම මේ තාපසවරුන් වන අපට සුදුසු දෙයක් නොවේ. අනුන්ට අයත් වස්තුව පිළිබඳව අපට ලෝභය වැනි හැඟීමක් උපදින්නේ නැත." යනුවෙනි. තාපසයාණන්ගේ එම වචන අසා ධනවත් තරුණයාට තාපසයා කෙරෙහි ඇති කර ගෙන තිබූ පැහැදීම තව තවත් වැඩි වී ගියේය. ඒ අනුව සිය වස්තුව සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තමාගේ මුදලින් ම සාදා ගත් වෙහෙරෙහි වැඩ වසන තමාගෙන් සිව්පසය ලබන තාපසයාණන්ට බාර කර යන්නට ගියේය.

තරුණයා ගිය පසුව තාපසයා කල්පනා කරන්නට විය. මෙතන තිබෙන රත්‍රන් මැණික්වල වටිනාකම ඉතා ඉහළයි. මහත් ධනයකි. මෙය අරගතහොත් ජීවිත කාලයට ඇති. කිසිවෙකුටත්

යටත් නොවී යහතින් ජීවත් විය හැකි කියා තණ්හා සිතුවිල්ලක් ඇතිකර ගත්හ. ඒ අනුව කීප දවසක් ගිය පසු කිසිවෙකුටත් නො දැනෙන සේ තිබූ තැනින් එම වස්තුව රහසින් අරගෙන ගොස් වෙන තැනක සඟවා තැබුවේ ය. වස්තුව වෙනත් තැනක සඟවා තබා පසුදා ඒ ධනවත් තරුණයාගේ නිවසට දානය පිණිස ගිය තාපසයා එම අවස්ථාවේ දානය වළඳා මෙසේ කීය. "පින්වත, මම බොහෝ දවස් ඔබගේ ඇප උපස්ථාන ලබා මෙහි වාසය කරමි. දැන් බොහෝ කාලයක් ගත වී ඇත. මෙසේ බොහෝ කාලයක් වාසය කරමින් ගිහි අය සමඟ මිත්‍ර වීම තපස් දිවියේ සාර්ථකත්වයට බාධාවකි. එය තාපසයන්ට කිළුටක් හා සමාන ය. අපට වැදගත් වෙන්නේ මිල මුදල් හෝ ඇප උපස්ථාන නොව තපස් ධර්ම රැකීමයි. එම නිසා ඔබ තනා දුන් පන්සල හැර මම වෙනත් තැනකට යන්න අධිෂ්ඨාන කළෙමි."

එම ධනවත් තරුණයා තාපසයාගේ උතුම් ගුණධර්ම ගැන වඩාත් ප්‍රසාදයට පත්ව තමාගෙන් ඉටුවිය යුතු උපකාරයක් තිබේ දැයි අසා එසේ ඇති නම් තමාට දන්වන්නැයි කීය. එම වෙහෙරේ ම නතර කර ගැනීමට උත්සාහ කළහ. එසේත් කිරීමට නො හැකි වූ පසු ගමේ කෙලවර දක්වා තාපසයා සමඟ පසුපස ගමන් කොට තාපස දිවියට සුබ පතා මග නතර වී ආපසු සිය නිවසට ගියේ ය. එසේ උපකාර කළ ධනවත් තරුණයාට තමාගේ නිවැරදිභාවය තවදුරටත් පෙන්විය යුතු යැයි සිතූ තාපසයා ආපසු එම තරුණයාගේ නිවෙසට ගියේ ය. නැවතත් නිවසට පැමිණෙනු දුටු තාපසයාණන් දැක "කිමෙක්ද ස්වාමීනි ආපසු වැඩියේ" යැයි ධනවත් තරුණයා අසන්නට විය. එවිට තම ජටාවෙහි රැඳී ඔබට අයිති තණකොළ පතක් තිබෙන බවත් අන්සතු දේ ගැනීම අප වැනි අයට සුදුසු නොවන බවත් තාපසයා කීය. "ස්වාමීනි, මෙබඳු දෙයකින් ඔබට කුමන දෝෂයක් වේද? එය හැරදමා වැඩිය මැනවි" ධනවත් තරුණයා කියන්නට විය. තාපසයාගේ එම බස් අසා තවදුරටත් ඉතාමත් පැහැදීමට පත් වූ තරුණයා සිතන්නට වූයේ "අනේ මාගේ තාපසයාණෝ තමා අතින් සිදුවෙන පාපයන්ට ඉතාමත් ම ශෝකයට පත්වන කෙනෙකි. අනුනට අයත් වස්තුවෙන් තණකොළයක් තරම්වත් අර ගැනීමට සිතන කෙනෙක් නොවේ" යනුවෙනි.

එදින රාත්‍රියෙහි යාබද ගමට වෙළඳාමේ යන අමුත්තෙක් ධනපති තරුණයාගේ නිවසට පැමිණියේය. රාත්‍රියේ ඔහු නවාතැන් ගත්තේත් එම නිවසෙහි ය. රාත්‍රි නින්දට යාමට පෙර දෙදෙනා අතර විවිධ කතාබස් ඇති විය. එම අවස්ථාවේ දී ධනවත් තරුණයා විසින් තම තාපසයන්ගේ සීලවන්ත බව සහ සිදු වූ සිද්ධිදාමය ඒ අමුත්තාට කියන්නට වූයේ ය. එය අසා සිටි බුද්ධිමත් ආගන්තුකයා තාපසයාගේ කපටි බව පිළිබඳ දැන ඒ තාපසයා ළඟ තිබූ යම් කිසි වස්තුවක් ඇත්දැයි තරුණයාගෙන් විමසීය. එවිට තරුණයා පවසන්නට වූයේ මැණික් සියයක් තැබූ බවයි. එසේ නම් පන්සලට ගොස් තිබූ වස්තුව එසේ ම තිබේදැයි බලන ලෙස කීය. අනතුරුව ආරාමයට ගොස් බැලූ විට ඒ වස්තුව

කුහක ගති සහිත පුද්ගලයා කුහකයකු ලෙස නිවැරදිව හඳුනා ගැනීමට නම් සූක්ෂමවත්, සියුම්වත් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් ඉතා මැනවින් අධ්‍යයනය කළ යුතු බව කියා දෙයි. එසේ නිරීක්ෂණ නො කළ බොහෝ අය හට කුහකයා ගැන දැනෙන්නේ ඔහු තමාට උදව් උපකාර කරන, තමාට දැඩි සේ ආදරය කරන පුද්ගලයා කියා ය. තමාට සිටින එකම ගැලවුම්කාරයා කියා ය.

නොමැති බව දැන ගත්තේ ය. මේ හොර තාපසයා සියල්ල ගෙන ගොස් තිබෙයි. ඔහු වහාම අල්ලාගෙන ප්‍රශ්න කරන්න යැයි කී විට ධනපති තරුණයා එයට පසු බැස්සත් නැවත නැවතත් කියන විට තම නිවසට පැමිණ සිටි අමුත්තන් සමඟ එම තාපසයා පසුපස ගොස් අල්ලා ගෙන ගුටිබැට දී විමසන විට සත්‍ය සිද්ධිය කීවේ ය. මේ තරම් වස්තුව රැගෙන හොරකම් කොට ජටාවේ බැඳුණු තණ පත්‍රය අනුන්ගේ දෙයක් යැයි ආපසු ගෙනත් දුන්නා නොවේදැයි කියා මෙබඳු වැරදි නොකරනන යැයි ධනවත් තරුණයා තාපසයාට අවවාද කළේ ය. අනතුරුව සඟවා තිබූ තැනින් සියලූ වස්තුව

සොයාගනු ලැබූ ආගන්තුක වෙළෙන්දා එදා රෑ නිවසේ නවාතැන් දුන් එම තරුණයාට මිනිසාගේ මනසේ ඇති කුහක බව හා එහි ස්වභාවය කියා දුන්නේ ය.

දම්සභා මණ්ඩපයෙහි භික්ෂූන්ට මෙම ධර්ම දේශනාව දේශනා කර අවසානයෙහි බුදුරජාණන් වහන්සේ විසින් පූර්වාපර සන්ධි ගලපා දැක්වූයේ එකල හොර තපස් රකින්නට වූ ජටාධර තාපසයා නම් මේ කොහොන් තපස් රකිනා භික්ෂුව බවත් එසමයෙහි ඥානසම්පන්න වූ සිටු පුත්‍රයා නම් සර්වඥ වූ තථාගතයන් වහන්සේ වන මම ම වූ බවත් ය.

බොහෝ මිනිසුන් තුළ මෙම තාපසයාගේ මෙන් ගති ස්වභාව තිබේ. ඇසුරු කිරීමෙන් ම ඒවා හඳුනාගත යුතුය. හොර තපස් රකින්නා වූ එක්තරා භික්ෂූන් වහන්සේ කෙනෙකුගේ කුහකවත අරභයා දේශනා කරන ලද මෙම ජාතක කථාව මඟින් කුහක ගති සහිත පුද්ගලයා කුහකයකු ලෙස නිවැරදිව හඳුනා ගැනීමට නම් සූක්ෂමවත්, සියුම්වත් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් ඉතා මැනවින් අධ්‍යයනය කළ යුතු බව කියා දෙයි. එසේ නිරීක්ෂණ නො කළ බොහෝ අය හට කුහකයා ගැන දැනෙන්නේ ඔහු තමාට උදව් උපකාර කරන, තමාට දැඩි සේ ආදරය කරන පුද්ගලයා කියා ය. තමාට සිටින එකම ගැලවුම්කාරයා කියා ය. තමාගේ මවටත්, පියාටත් වඩා ඇතැම් විට තම බිරිඳටත්, තම සැමියාටත් වඩා හිතවත් පුද්ගලයා ඔහු කියා ය. එසේ සිතා කටයුතු කරනු ලබන්නේ කුහකයා තුළ තිබෙන කුහක ගතිවල පවතින සියුම්භාවය නිසා ය. එය හඳුනා ගැනීම අපහසු නිසා ය. පුද්ගලයන් ඇසුරු කිරීමේ දී ඔවුන් පිළිබඳව සූක්ෂමවත්, සියුම්වත් අධ්‍යයනය කොට ඒ ඒ පුද්ගලයාගේ ස්වභාවය නිවැරදිව හඳුනා ගත යුතු බව මෙම ජාතක කතාවෙන් සමාජයට කියා දෙයි.

**ආර්.එම්. දිලිනි දිල්රුක්ෂි**
බෞද්ධ ශිෂ්ටාචාරය ගෞරව උපාධි අපේක්ෂිකා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ**

## ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දායකත්වයන් ලබාගැනීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් පාලනය කරනු ලබන භික්ෂු විවේකාශ්‍රම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 27 ක් ඇත.

එම ආයතන සඳහා ඔබගේ දායකත්වයන් ලබාදීමට කැමැත්තක් දක්වන්නේ නම් අප වෙත යොමුවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**වැඩි විස්තර**
**www.acbc.lk වෙබ් අඩවිය**
**වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.**

*නැතිනම් පහත දුරකතන අංකවලින් විමසන්න.*
**දුරකථන : 0112 669017, 0112691695**


## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් බෞද්ධයනට එරෙහි ක්‍රියාවන් හා අන්‍යාගමිකකරණය පිළිබඳ තොරතුරු ඇතුළු තොරතුරු සොයා බලා කටයුතු කිරීම සඳහා 'බෞද්ධ තොරතුරු' මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත.**

වැඩි විස්තර

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**දුරකථනය : 0112 665047**
**ෆැක්ස් : 0112 665048**
**ජංගම දුරකථනය : 071 8645554**

# බුද්ධ කාලීන භාරතීය සමාජ පසුබිම



බුදුරජාණන් වහන්සේ භාරතය තුළ පහළ වූයේ ක්‍රි.පූ 6 වැනි සියවසේ දී යන්න පොදු පිළිගැනීම යි. ඒ වන විට භාරතීය සමාජය ඉතා සංකීර්ණ සමාජයක් විය. උන්වහන්සේ ලොව පහළ වන විට භාරතීය සමාජය තුළ ආගම් හැට දෙකක් පැවති බවට සාක්ෂි ඇත. ආගම් අතර බ්‍රාහ්මණ ආගම ප්‍රධාන ස්ථානයක් ගත් බව සඳහන් කළ යුතුය. එකල සමාජ ආධිපත්‍යය හිමිකරගෙන සිටියේ බ්‍රාහ්මණ ආගම යි.

බුද්ධ කාලීන භාරතීය සමාජය බ්‍රාහ්මණ වේද ධර්මයන්ට සහ බ්‍රාහ්මණ විනය නීති රීතීන්ට අනුව හැඩ ගැසී පැවතින. ඊශ්වර ඇදහීම, ඊශ්වර නිර්මාණවාදය යන ප්‍රධාන අංග බ්‍රාහ්මණ චින්තනයේ හදවත යි.

වේදය යනු ඔවුන්ගේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය යි. ඔවුන්ගේ සෑම අංගයක් ම මෙම ග්‍රන්ථයට අදාළව සංවිධානය කර ඇත. සමාජ ප්‍රභවය, වර්ණ ධර්ම, ආපද් ධර්ම, අයිතිවාසිකම්, යුතුකම් පිළිබඳ විෂමතා, කාන්තාව සතු වගකීම් හා ඇයට සමාජය තුළ හිමි ස්ථානය යනාදී වශයෙන් කරුණු රැසක් සඳහන් කර ඇත.

බ්‍රාහ්මණ අදහසට අනුව සියල්ලට අධිපති යැයි සලකන ලද්දේ මහා බ්‍රහ්ම සංකල්ප යි. ලොව මැවුම්කාර දෙවියා මහා බ්‍රහ්මයා ය. සර්ව බලධාරී යන නාමයෙන් ඔහු හඳුන්වනු ඇත. වේදය පහළ වූයේ ද බ්‍රහ්මයාගෙන් යැයි විශ්වාස කරන ලදි. ගුරු ශිෂ්‍ය පරපුරෙන් පරපුරට බ්‍රාහ්මණයන් විසින් වේදය පවත්වාගෙන යන ලදී. ඒ අනුව සමාජ ප්‍රභවය පිළිබඳව කරුණු දක්වන ලද්දේ ද වේදය අනුව යි. කාව්‍ය නාටක ආදී සියලු කලාවන්, සාරධර්ම ශාස්ත්‍රයන්ට ඇතුළු සෑම දෙයක් ම දෙවියන් බ්‍රහ්මයන් විසින්ම සිදුවී යැයි සැලකීම පුරාතන භාරතීය ජනයාගේ සම්ප්‍රදාය යි. ඒ අනුව සමාජය මහා බ්‍රහ්මයාගෙන් උපන්නේ යැයි සලකන ලදී. කලින් කල පහළ වූ වේද ග්‍රන්ථ සමූහ අතර වඩාත් ම පැරණි කෘතිය වන්නේ ඍග් වේදය යි. සමාජය මහා බ්‍රහ්මයා විසින් මවන ලද ආකාරය ඍග්වේදයේ දහවෙනි මණ්ඩලයෙහි සඳහන් මෙම ශ්ලෝකයෙන් පැහැදිලි වේ.

**"බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසීද් - බාහු රාජන්‍යඃ කෘතඃ**
**ඌරු තදස්‍ය යද් වෛශ්‍ය - පද්භ්‍යාං ශුද්‍රෝ අජායත"**

බ්‍රාහ්මණ මතයට අනුව සමාජය කොටස් හතරකින් යුක්ත ය. එම කොටස් හතර මහා බ්‍රහ්මයාගේ නිර්මාණයක් බව සඳහන් කරයි. ඒ අනුව මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බ්‍රාහ්මණ වංශය ද, මහා බ්‍රහ්මයාගේ දෙබාහුවෙන් ක්ෂත්‍රිය වංශය ද, මහා බ්‍රහ්මයාගේ දෙකලවා වලින් වෛශ්‍ය වංශය ද, බ්‍රහ්මයාගේයටිපතුල්වලින්ශුද්‍රවංශයද,නිර්මාණයවූ බව මනුස්මෘතියේ සඳහන් වේ.

එබැවින් සමාජ සංස්ථාව ආගමික පසුබිමක් යටතේ සංවිධානය සහ පාලනය කිරීමේ පූර්ණ

බලය බ්‍රාහ්මණයෝ නතු කරගෙන සිටියහ. එසේම ඔවුන්ට වාසි සහගත වන අයුරින් සියල්ල සකස් කර ගැනීමට උත්සුක වීය. දෙවියන් යැදීමේ දී විවිධ යාග ක්‍රම සකස් කළ බ්‍රාහ්මණයින්, යාඥා කිරීම සහ පූජාවන් පැවැත්වීමේ සම්පූර්ණ අයිතිය ඔවුන් සතු කරගත් හ. බමුණන් විසින් හඳුන්වා දුන් යාග හෝම පූජාවන් හේතුවෙන් සමාජ සුභ සිද්ධිය සහ සමෘද්ධිය ඇති වන බව ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. "වේද සංහිතා" හි බ්‍රාහ්මණ ධර්මය අන්තර්ගතව ඇත. මෙය ආප්තිය සහ ශ්‍රැතිය ලෙසින් ද වේද ධර්මය හඳුන්වනු ලැබේ.

වේද ධර්මයේ ඇතුලත් වන්නේ දේව භාෂිතය යැයි බ්‍රාහ්මණයෝ පැවසූ හ. එබැවින් වේද ධර්මයේ අන්තර්ගතය විමසීමකින් සහ ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගත යුතු යැයි අවධාරණය කළහ. මෙහි දී අධ්‍යාපනය හැදෑරීම යනු වේදය හැදෑරීම ය. අධ්‍යාපනික වශයෙන් උසස්ම දෑ වේදය තුළ ඇති මන්ත්‍ර හැදෑරීම ය. වේදය උගැන්වීම බමුණන් සතු කාර්යයක් විය. එබැවින් සියලු තන්ත්‍ර මන්ත්‍ර විද්‍යාවන් ඉගෙන ගැනීමට සෙස්සෝ බමුණන් වෙත ගියහ. දේශය පාලනය කරන රජවරුන්ගේ උපදේශකවරුන් හෙවත් පුරෝහිත තනතුරුද බ්‍රාහ්මණයෝ හෙබවූ හ. එමගින් රාජ්‍ය තන්ත්‍රයේ දේශපාලන ශක්තිය බමුණන්ට උරුම විය.

සමාජය කොටස් වලට වර්ග කළ ඔවුන්, ඒ ඒ වර්ණයට අයත් ජන කොට්ඨාසවලට අයත් කාර්යයන් ලෙස බ්‍රාහ්මණ වර්ණයට අදාළව, ඉගෙනීම, ඉගැන්වීම, යාග කිරීම, දානය, දානය පිළිගැනීම යන ප්‍රධාන කොටස් අයත් වේ. ක්ෂත්‍රීය වර්ණය උදෙසා, ප්‍රජාව පාලනය කිරීම, දන් දීම, යාග කිරීම, වේද අධ්‍යාපනය, කාමයේ නොඇලීම යනාදී අංග ඇතුළත් වේ. වෛශ්‍ය වර්ණය සඳහා සත්ව පාලනය, දන් දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළඳාම, මුදල් පොලියට දීම, කෘෂිකර්මය අයත් විය. ශූද්‍ර වර්ණයට හිමි වූයේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය සහ වෛශ්‍ය වර්ණ වලට අයත් ජනයාට මෙහෙකාරකම් කිරීම යි.

වර්ණය යනු පාට ය. බ්‍රාහ්මණයන් "වර්ණ" යන්න භාවිත කරනුයේ "කුලය" හැඳින්වීමට ය. ඒ අනුව "වර්ණ" යනු කුල භේදය යි. මෙම ප්‍රධාන කුල වර්ග හතරට අමතරව බුද්ධ කාලීන සමාජයේ වෙනත් කුල රාශියක් තිබී ඇත. රථාකාර කුල, මාලාකාර කුල, චණ්ඩාල කුල ආදී වශයෙන් වෙනත් කුල ද පැවතිණ.

මෙසේ විවිධ වර්ණ ධර්ම පදනම් කරගනිමින් සමාජ විෂමතා රැසක් බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ දැක ගැනීමට හැකි විය. කුල භේදය පදනම් කරගෙන මූලික වශයෙන් විෂමතාවන් ඇති වූ බව පෙනේ. සමාජ ප්‍රභවය පිළිබඳ මුලින්ම දක්වන ලද බ්‍රාහ්මණ මතය අනුව ප්‍රධාන සතර කුල ක්‍රමය චතුරාර්ය යනුවෙන් හැඳින්වේ. වර්ණය යන පදයෙන් එහිදී හඳුන්වා ඇත්තේ මිනිසාගේ පැහැයයි. ක්‍රි.පූ. 1500 දී පමණ මධ්‍ය ආසියාවේ සිට ඉන්දියාවට සංක්‍රමණය වූ මිනිසුන් එනම් මුල්ම ආර්යයන් පැහැපත් සමකින් යුතු කොටසක් වූ බව සැලකිය හැකිය. ඉන්දියාවේ සිටි මුල් පදිංචිකරුවන් කළු පැහැයෙන් යුක්ත ය. භාරතීය ශිෂ්ටාචාරය ආදිත ම යුගයේ සේ සැලකෙන්නේ මධ්‍ය ආසියාවෙන් පැමිණි ආර්යයන් එහි මුල්ම ජනාවාස පිහිටුවා ගත් අවධිය යි. ඔවුන් විසින් තමන්ට හමුවූ කාලවර්ණ පිහිටා ඇති එම මුල් පදිංචිකාරයන් පහත් කොට සලකා තිබේ.

මේ අනුව මුලදී වර්ණ භේදය ජාතිභේදය මතය මුල් කාලයේ ඇතිවූ අතර ක්‍රමයෙන් එය වෙනස් විය. මුලදී වර්ණය මතම ආර්ය අනාර්ය භේදය ම සලකා තිබේ. එහෙත් ආර්ය සභ්‍යත්වය භාරතය තුළ සංවිධානාත්මක පිහිටුවීමේ දී වර්ණභේදය වෙනත් මුහුණුවරක් ගත්ත හ. ඒ සඳහා මුල් වූයේ ආර්ථික කටයුතු ය. ඒ අනුව කුල භේදය ඇති විය. කුලය අනුව මිනිසාගේ උසස් බව හෝ පහත් බව තීරණය කරන ලදී. කුලය උපතින්ම හිමිවන්නකි. උසස්යයි සම්මත කුලවල උපන් අය මිනිස් සමාජයේ වැඩි වරප්‍රසාද හිමි කරගත්තේ ය. පහත් යයි සම්මත කුලවල ජනයාට ඇතැම්විට මූලික මිනිස් අයිතිවාසිකම් පවා අහිමිවිය. සමාජයේ උසස්ම ස්ථානය හිමි වූයේ බ්‍රාහ්මණ කුලයට ය. ඔවුන් වැඩි වරප්‍රසාද දිනා ගනිමින් සමාජයේ නියමුවන් ලෙස පෙනී සිටියේ ය. පහත් යයි සම්මත කුලවල ජනතාව ඉතාම පීඩිත තත්ත්වයකට පත් විය. මෙවැනි සමාජ විෂමතා රැසක් බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ දැක ගැනීමට හැකි විය.

බමුණු මතය අනුව කාන්තාවට හිමි වූයේ ඉතා පහත් තත්වයකි. ඇයට මවක හෝ බිරියක

වශයෙන් හිමිවිය යුතු නිසි තැන නො ලැබිණි. මහා බ්‍රහ්මයා විසින් කාන්තාවන් මවන ලද්දේ පිරිමින්ගේ විනෝදය සඳහා යැයි සැලකිනි. ආගමක් ඇදහීමට එයට අදාළ වත්පිළිවෙත් වල නියැලීමට, ආගමික ග්‍රන්ථ ඇසීමට හෝ කියවීමට ඇයට මුල දී අහිමි විය. කවර ආකාරයක හෝ ආගමික සම්බන්ධතාවයකින් තොර ඉතා අසහනකාරී ජීවිතයක් එකල භාරතීය කාන්තාවට උරුම වී තිබිණි. එසේම ඇයට තමාගේ රිසි පරිදි රැකියාවක් කිරීමේ උරුමය ද අහිමි විය. පිරිමින්ට සමාන සමාජීය උරුමයන් බොහෝමයක් ඇයට හිමි නොවීය. සමාජ සංවිධානය තුළ බමුණන්ගේ ආධිපත්‍යය තහවුරු වීමට පෙර කාන්තාව කිසියම් සමාජ වරප්‍රසාද සමූහයක් භුක්ති වින්ද බව පෙනේ. එහෙත් බමුණු ආධිපත්‍යය තුළ ඇය ඇද දමා තිබුණේ ඉතා පහත් වූ ස්ථානයකට ය. පුරුෂයාගේ ආගමික විමුක්තියට බාධාව කාන්තාව බව එකල සලකා තිබේ. ඒ අනුව ඇය සම්පූර්ණයෙන්ම ආගමේ ආශිර්වාදය නො ලැවුවා ය. එසේම මනුස්මෘතියට අනුව,

**"බාලෙය පිතුර්වශේ තිෂ්ඨේත් - පාණිගහස්‍ය යෞවනේ**
**පුත්‍රාණං හර්තරි ප්‍රේතේ - න භජේත් ස්ත්‍රී ස්වතන්ත්‍රාම්"**

බුද්ධ කාලයට සමකාලීන බ්‍රාහ්මණ සමාජයේ කාන්තාවගේ පසුබිම මනුස්මෘතියේ ඉහත ආකාරයට දක්වා ඇත. එනම් උපතේ සිට මරණය දක්වා ගැහැණිය පිය, ස්වාමිපුරුෂ, පුත්‍ර ආදීන් යටතේ සිටිය යුතු බවත්, කිසිම ලෙසකින් ස්වතන්ත්‍රව ජීවත් නොවිය යුතු බවත් ය.


බුද්ධකලීන සමාජයේ පිරිමි දරුවෙක් ලැබීම උදෙසාපූජා,මේපූජාපවත්වාඇත.නූතනඉන්දියාවේද ඇතැම් ප්‍රාන්තයන්හි ගැහැණු දරුවා අනවශ්‍ය බරක් ලෙස සලකයි. මෙය හැඳින්විය හැක්කේ දරිද්‍රතාවයේ සහ නූගත් කමේ අතුරු ඵලයක් ලෙසයි. ගැහැණු දරුවෙක් ඉපදුණු විට ඇය ආවාහ කරදෙන අවස්ථාවේ දිය යුතු දෑවැද්ද පිළිබඳව දෙමාපියන්ගේ අවධානය යොමු විය යුතුය. මිල නියම කිරීම අමානුෂික චාරිත්‍රයකි. බුදුන් වහන්සේ ගැහැණු දරුවා සහ පිරිමි දරුවා වශයෙන් ලිංග භේදය නොසලකා හැරි අයෙකි. මල්ලිකා දේවියට ගැහැණු දරුවෙකු ඉපදුණු කල්හි බුදුන් වහන්සේ කොසොල් මහ රජතුමාගේ සිත් තැවුල් පහ කළ සේක.'ඇතැම් විට ගැහැණු දරුවා පුතකුට වඩා යහපත් දරුවෙකු විය හැකිය' යි කියමින් එක සමාජයේ පැතිර තිබුණු විශාල දුර්මතයක් ඉවත් කළ සේක.

බුද්ධ කාලීන භාරතයේ විවාහ ක්‍රම තුනක් පැහැදිලිව හඳුනාගත හැකිය. සාමාන්‍ය විවාහ ක්‍රමය නම් වයස සම්පූර්ණ වූ විට (අවුරුදු දාසය පමණ) මවුපිය කැමැත්ත විමසා සුදුසු පුරුෂයෙකු හා ගැහැණියක සමඟ විවාහ වීමයි. වඩා ප්‍රචලිත ක්‍රමය මෙය වේ. දෙවන ක්‍රමය නම් ස්වයංවරයයි. පුරාණ හින්දු කතාවල මෙන්ම, කුණාල ආදී ජාතක කතාවල ද ගැහැණියට තම ස්වාමි පුරුෂයා තෝරා ගැනීමේ නිදහස, 'ස්වයංවරය' ගැන කියවේ. කාන්තාව ඉතා රූමත් නම් ඇය ලබා ගැනීම සඳහා තමා සතු ශිල්පය දැක්විය යුතුය. වඩා ප්‍රේමණීය, ශක්තිමත් සිත්ගත් පුරුෂයෙකු තෝරා ඔහුගේ ගෙල වට මල් දමක් දැමීමෙන් විවාහය ස්ථිර විය. තෙවැනි ක්‍රමය නම් ගාන්ධර්ව විවාහ චාරිත්‍රයයි. පවුල් පසුබිම, චාරිත්‍ර වාරිත්‍ර, දෙමාපිය වැඩිහිටි මත විමසුම් කිසි දෙයක් මීට අදාළ නොවේ. ප්‍රේමයෙන් දෑස් අන්ධ වුවට පසු ඇතිවන බැඳීම නම් ගාන්ධර්ව විවාහය යි.

බුදුන් වහන්සේ ස්ත්‍රීන්ගේ නිදහස සහ ගෞරවය වෙනුවෙන් සටන් කළ අයෙකි. බුද්ධ ධර්මය නිසා සැලකිය යුතු ලෙස භාරතීය කාන්තාවගේ ජීවන රටාව වෙනස් විය. ගැහැණිය යනු කාමය වඩන මෙවලමක්, දාසියක් පමණක් නොව උතුම් වූ රහත් තත්වයට පවා පත්විය හැකි මනුස්ස දියණියක බව බුදුන් වහන්සේ පෙන්වා දුන් සේක. බුදුරජාණන් වහන්සේගේ පහළ වීමත් සමඟ බ්‍රාහ්මණ ඉගැන්වීම් පදනම් කොට ගෙන ගොඩනැඟී තිබූ මතවාද සමස්ත සමාජය තුළ ක්‍රමයෙන් සාකච්ඡාවට බඳුන් විය. මෙම විෂම සමාජ සංවිධාන ක්‍රමය බුදුරජාණන් වහන්සේ විවිධ සාධක ගෙනහැර දක්වමින් දැඩි ලෙස විචාරයට ලක් කරන ලදී. ඒ අනුව පුද්ගලයාට සුවිශේෂී ස්ථානයක් සමාජය තුළ ලැබිණි. කාන්තාවට ද බෞද්ධ සංකල්පය තුළ පුරුෂයාට මෙන් සමාන අයිතියක් ලැබිණි.

**ඩී.එම්. තුෂාරි මංගලිකා**
බෞද්ධ ශිෂ්ටාචාරය ගෞරව උපාධි අපේක්ෂිකා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ත්‍රිලක්ෂණය හා ඛන්ධායතන ධාතු විභාගය



බුද්ධ කාලීන භාරතයේ පැවැති නොයෙක් ආගම්වලින් සදාතනික බව හා අනිත්‍ය බව යන කරුණු දෙකම පෙන්වා දෙන ලදී. හින්දු හා ජෛන දහමේ එන ආත්මන් හා බ්‍රහ්මන් තත්වයන් ද පකුධකච්චායන ගේ දර්ශනයේ ද01 ලොව සදාතනික වශයෙන් යමක් ඇතයි සදහන් කරන ලදී.

**"න ජායතෙ ම්‍රියතෙවා විපශ්චින් "**
**නායං කුතශ්චින්න බභූව කශ්චිත්**
**අජෝ නිත්‍යඃ ශාශ්වතො යං පුරාණො**
**න හන්‍යතෙ හන්‍යමානෙ ශරීරෙ**

තථාගතයාණන් වහන්සේ ත්‍රිලක්ෂණය පෙන්වා දුන්නා මිස අලුතින් ඇති කළ දෙයක් නොවේ.

**උපපාදවා තථාගතානං අනුපපාදවා තථාගතානං ඨිතාවා සා ධාතු ධම්මට්ඨිතිතා ධම්ම නියාමතා සබ්බෙ සංඛාරා අනිච්චාති තං තථාගතො අභිසම්බුජ්ඣතිවා පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානිකරොති සබ්බෙ සංඛාරා අනිච්චාති ....................සබ්බෙ සංඛාරා දුක්ඛාති.................... සබ්බෙ ධම්මා අනත්තාති**

### ලෝකයේ ස්වභාවය

**ලොකො ලොකොති ඛො භනෙත වුච්චති**
**කිත්තාවතානුඛො භනෙත ලොකොති වුච්චති**
**ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකොති වුච්චති -**

සච්චක සූත්‍රය

### අනිත්‍යතාව

හේතු ඵල සම්බන්ධතාවයෙන් ලොව හටගන්නා සියලු ධර්මයෝ සංඛත ධර්ම, අසංඛත ධර්ම වශයෙන් හැඳින්වේ. මෙහිලා එම සංඛත ධර්මයන්ගේ ස්වභාව ආකාර තුනක් ඇති බව බුදුරජාණන්වහන්සේ පෙන්වා දෙන ලදී. එනම්

**"තීණිමානි භික්ඛවෙ සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානි කතමානි තීණි උප්පාදො පඤ්ඤායති වයො පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති"**

- පංච උපාදානස්කන්ධයම ඉහත ලක්ෂණත්‍රයට යටත් වන අතර සියලුම සංස්කාර ධර්මයෝ ඒකාන්ත වශයෙන්ම අනිත්‍යය. ඉපිද නැසෙන ස්වභාවයෙන් යුක්තය. ඒ නිසා සංසිඳීම සැප යැයි මහාසුදස්සන සූත්‍රයේ පෙන්වා දී වදාළහ.

**"අනිච්චාවත සංඞ්ඛාරා උප්පාද වය ධම්මිනො උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසංවූපසමොසුඛො"**

- චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන, යන ආයතන සහ එය උපාදානය කරගනු ලබන්නා වූ සියල්ලම නිත්‍ය නොවන අතර අනිත්‍යය බවයි.

**"සබ්බං භික්ඛවෙ අනිච්චං කිඤ්ච භික්ඛවෙ සබ්බං අනිච්චං චක්ඛුං භික්ඛවෙ අනිච්චං රූපං අනිච්චා චක්ඛු විඤ්ඤාණා අනිච්චා"**

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියල්ල නිත්‍ය නොවන හා වෙනස් වන බව අවබෝධ කරගැනීම ලෙස බුදුරජාණන්වහන්සේ පෙන්වා දෙන ලද්දේ ය.

**"යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මංති ධම්මචක්ඛුං උදපාදි"**

### දුක්ඛතාව

ත්‍රිලක්ෂණයේ දෙවන ලක්ෂණය වන්නේ දුක්ඛතාවය යි. එහිලා සංයුක්ත නිකායේ දුක්ඛ සූත්‍රයේ මෙලෙස දක්වයි.

**"කතමංනු බො අවුසො දුක්ඛංති තිසෙසා ඉමා අවුසො දුක්ඛතා දුක්ඛදුක්ඛතා සංඛාර දුක්ඛතා විපරිණාම දුක්ඛතා"**
**"ඉදං බො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං ජාතිපි දුක්ඛා ජරාපි ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං..."**

### අනාත්මතාව

**"වරං භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො ඉමං චාතුම්මහා භූතිකං කායං අත්තනො උපගච්ඡෙය්‍ය නත්වෙව..."**

ආත්මීය හැඟීම් පහළ වන්නේ කවර හේතූන් නිසාවෙන් ද යන්න සංයුක්ත නිකායේ සඳහන් කර තිබේ. එනම්

01 ජීවිතුකාම - බොහෝ කල් පැවැත්මට ඇති කැමැත්ත

02 අමරිතුකාමා - අමරණීය වීමට ඇති කැමැත්ත

03 සුඛකාමා - සැප විඳීමට ඇති කැමැත්ත

සංයුක්ත නිකායේ අනත්ත යනුවෙන් පෙන්වා දෙන්නේ

**"රූපං භික්ඛවෙ අනත්තා වෙදනා අනත්තා සඤ්ඤා අනත්තා සංඛාරා අනත්තා විඤ්ඤාණා අනත්තා"**

මහණෙනි රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ, යන ස්කන්ධ ධර්ම ආත්ම නොවන බව වදාරන වරක් නිඝණ්ඨ ශ්‍රාවකයෙකු වූ සච්චක බුදුරදුන් සමඟ වාදයට පිළිපන්නහ. හෙතෙම වාදකරනුයේ භවත් ගෞතමයෙනි මම රූපය, වේදනාව, සංඥාව, සංඛාර හා විඥ්ඥාණය ආත්මය යැයි කියමි යනුවෙනි. බුදුරදුන් එකවර මෙය ප්‍රතික්ෂේප කිරීමට නොගොස් එකී කරුණු ම භාවිත කරමින් ප්‍රශ්න කිරීමකට ලක් කළහ.

මාගේ ආත්මය යැයි කියන රූපය මෙසේ වේවා මෙසේ නොවේවා යැයි පැවැත්විය හැකි ද? එහි දී සච්චක නිරුත්තර වූහ. අනෙකුත් ස්කන්ධ ධර්ම සම්බන්ධයෙන් ද මෙලෙසින් ප්‍රශ්න කළහ. එහිදී තම ආධිපත්‍යයේ එලෙස පැවැත්විය නොහැක්කේය යන්න සච්චක පිළිගත්තේය.

අනතුරුව ත්‍රිලක්ෂණයට අනුව විමසා බලමින් ස්කන්ධ විෂයෙහි ප්‍රශ්න තුන බැගින් ඉදිරිපත් කළහ.

**1 ප්‍රශ්නය** - රූපං නිච්චං වා අනිච්චං වා - රූපය නිත්‍ය ද අනිත්‍ය ද

**පිළිතුර** - අනිච්චං ච හො ගොතම - භවත් ගෞතමයෙනි අනිත්‍යය

**2 ප්‍රශ්නය** - යංපනානිච්චං තං දුක්ඛං වා සුඛං වා - යමක් අනිත්‍ය නම් එය සැප ද දුක ද

**පිළිතුර** - දුක්ඛං හො ගොතම- භවත් ගෞතමයෙනි දුක ය

**3 ප්‍රශ්නය** - යම්පනානිච්චං දුක්ඛං විපරිණාම ධම්මං කල්ලනුතං සමනුපස්සිතුං එතං මම එසො අහං අස්මි එසො මෙ අත්තා - යමක් අනිත්‍ය නම් දුක් සහගත නම් එය මගේය මම වෙමි එය මගෙ ආත්මය යැයි ගැනීම සුදුසු ද

**පිළිතුර** - නොහිදං හො ගොතම - භවත් ගෞතමයෙනි නැත.

- සත්ත්ව පුද්ගල සංකල්පය පිළිබඳව විවරණය කෙරෙන

  ස්කන්ධ

  ධාතු


  ආයතන විභජනය පිළිබඳව විවරණය


(බාහිර) කථිකාචාර්ය

**පූජ්‍ය වැල්කෙනියායේ විමලවංශ හිමි**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# දහම් දැනුම



**ප්‍රශ්න**

1. සිදුහත් කුමරුන්ට හා යශෝධරා දේවියට ලැබුණු පුත් රුවන කවුරුන් ද?
2. සිදුහත් කුමරු ගිහි ගෙය හැර ගියේ වයස කීයේදී ද?
3. සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය සිදු කළේ කිනම් පොහෝ දිනක ද?
4. සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කළ කාලය කොපමණ ද?
5. දුෂ්කර ක්‍රියා කරන සමයේ බෝසතාණන්ට උපකාර කළේ කවුරුන් ද?
6. සිදුහත් තවුසාණෝ සම්මා සම්බුද්ධත්වයට පත් වූයේ වයස කීයේ දී ද?
7. සිදුහත් තවුසාණෝ සම්මා සම්බුද්ධත්වයට පත් වූයේ කිනම් පොහෝ දිනක ද?
8. බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය කුමක්ද?
9. බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනාව සිදු කළේ කාහට ද?
10. මධ්‍යම ප්‍රතිපදාව හඳුන්වන වෙනත් නම් මොනවා ද?
11. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් බැහැර කළ යුතු අන්ත දෙක මොනවා ද?
12 පස්වග තවුසන් අතරින් මුලින්ම ධර්මය අවබෝධ කරගනු ලැබුවේ කවුරුන් ද?
13. පස්වග තවුසන් රහත් වූයේ කුමන ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද?
14. පස්වග තවුසන් නම් කරන්න.
15. ප්‍රථම රහත් හැටනම සඳහන් කරන්න.

**පිළිතුරු**

1. රාහුල කුමරා
2. වයස අවුරුදු 29 දී
3. ඇසළ පෝය
4. අවුරුදු 06
5. පස්වග තවුසන්
6. වයස අවුරුදු 36 දී
7. වෙසක් පෝය
8. දම්සක් පැවතුම් සූත්‍රය
9. පස්වග තවුසන්ට
10. ආර්ය අෂ්ටාංගික මාර්ගය/අරි අටඟි මග
11. කාමසුඛල්ලිකානුයෝගය
    අත්තකිලමතානුයෝගය
12. අඤ්ඤා කොණ්ඩඤ්ඤ තවුසා
13. අනත්ත ලක්ඛණ සූත්‍රය
    අනාත්ම ලක්ෂණ දේශනාව
14. කොණ්ඩඤ්ඤ
    වප්ප
    භද්දිය
    මහානාම
    අස්සජි
15. පස්වග තවුසන් 05
    යසකුල පුත්‍රයා 01
    යහළුවෝ 54


**කේ.වී.ඩී. අමානි ඉසංගිකා**
තෙවන වසර
බෞද්ධ ශිෂ්ටාචාරය ගෞරව උපාධි අපේක්ෂිකා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# S5 සංකල්පය හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැකබලා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව





















# චෙන්නායි බෞද්ධ නායකයන්ගේ ශ්‍රී ලංකා සංචාරයේදී බොදු සමුළුවට පැමිණීම






# බෞද්ධ හින්දු එකමුතුව - ජාත්‍යන්තර සමුළුව

## පිල්ලෙයාර් නවාතැන







# සුභාවිත චරණයට මාධ්‍ය දිශානතිය
## මාධ්‍යවේදීන් සඳහා පැවැත් වූ වැඩමුළුව













# බුද්ධාගමේ දේශනය හා විවාදය මත ආගමික සංවාදයට මැදිහත්වීම යටතේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ බෞද්ධ ප්‍රවේශය ජාතික මණ්ඩලය සංවිධානය කළ දේශනය













# කැලණිය මානෙල්වත්ත විහාරස්ථානයේ
# සිල්මාතාවන් 3000ක් සඳහා පිරිනැමූ දානමය පුණ්‍යකර්මය











# මාතර - තරුණ බෞද්ධ සමිතියේ ත්‍යාග ප්‍රධානෝත්සවය












බෞද්ධාලෝකය®

ප්‍රකාශනය
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන: 011-2691695/2688517

ජාත්‍යන්තර ග්‍රන්ථ හඳුනාගැනීමේ සංකේතය
ISSN 2613-8743
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි අංකය
P 1567
තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය
QD/112/NEWS/2020

9 772613 874002

මිල
රු. 100/-

